FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු


# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER


FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2021
මාර්තු(මැදින්)
මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය
28





රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# මැදින් පෝය වර්ණනාව

අනුරාධපුර රාජධානියට (මැදින් මාසය) අයත් වැදගත් පිංබිමක් ලෙස මිරිසවැටි මහා දගැබ පිහිටි ස්ථානය සඳහන් කිරීමට පුළුවන. අනුරාධපුර වන්දනාවේ යන සැදැහැවතුන්ට අටමස්ථාන හමුවේ. එයින් එක් ස්ථානයක් වන්නේ මිරිසවැටි පූජනීය ස්ථානයයි. මෙම ස්ථානය පිළිබඳ තොරතුරු රාශියක් ''මහාවංශයෙහි'' දැක්වේ. දුටුගැමුණු රජතුමා එළාර රජු සමග සිදුකරන ලද මහාසංග්‍රාමයෙන් ජයලබාගෙන දින කිහිපයක් ගතවූවාට පසු තිසාවැවේ ජල ක්‍රීඩාවෙන් පසු සධාතුක ජයකොන්තය ආපසු ගැනීමට නොහැකි විය.

ඉන්පසු එම සධාතුක ජයකොන්තය නිධන්කොට එහිම ස්ථූපයක් ගොඩනැගීමට තීරණය කළ දුටුගැමුණු රජතුමා තම පළමු ශාසනික සේවයක් ලෙස මෙම ස්ථූපය නිර්මාණය කළ බව වංශකථාවෙහි සඳහන් වෙයි. යුධ සමයේ සංඝයා වහන්සේලාට පූජා නොකොට මිරිස් මාළුවක් අනුභව කිරීමේ දඬුවමක් වශයෙන් මෙය සෑදූ බව ඓතිහාසික ග්‍රන්ථවල දැක්වේ. ''මිරිසවැටිය'' යන නමින් මෙම ස්ථූපයට යෙදූ බවත් වැඩිදුරටත් විස්තර වෙයි. දුටුගැමුණු රජතුමා ස්ථූපය සෑදීමෙන් පසු භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා සංඝරාමයක්ද අනෙකුත් ගොඩනැගිලි ද නිමවා උත්සවයක් පවත්වා සංඝයා වහන්සේලාට පූජා කෙළේය.භික්ෂූන් වහන්සේලාත් භික්ෂුණීන් වහන්සේලාත් විශාල පිරිසක් මෙම අවස්ථාවට (ලක්ෂයක් පමණ) සහභාගි වූ බව වංශකථාවල සඳහන් වෙයි. මෙම ස්ථූපයේ විශේෂ ලක්ෂණය ලෙස සැලකෙන්නේ වාහල්කඩ සඳහා ගඩොල් භාවිතා නොකිරීමයි.

කළුගල් යොදාගෙන වාහල්කඩ සාදා තිබේ. ස්ථූපයේ සතර පැත්තේ වාහල්කඩ සතරකි. වාහල්කඩ දෙපැත්තේ උසින් අඩු කුළුණු දෙකකි. එක් කුළුණක වාමනයෙකු හිසමත තබාගත් පුන්කලසකින් ඉහළට නැගෙන කල්පවෘක්ෂයක් හා එය මුදුනේ ඡත්‍රයට මල්දම්වලින් යුක්ත ජයකොන්තයද වේ. දගැබ ඉදි වූ චතුරස්‍රාකාර මළුවෙහි එක් පසෙක දිග අඩි275කි. මෙම ස්ථූපය පළමුවන ගජබාහු රජතුමාද, වෝහාරික තිස්ස රජතුමාද, 5වෙනි කාශ්‍යප රජතුමාද, පළමුවන පරාක්‍රමබාහු රජුද නිශ්ශංකමල්ල රජුද මෙම ස්ථූපය ප්‍රතිසංස්කරණය කොට දියුණු කළ බව ''මහාවංශය'' සඳහන් කරයි. වර්තමානයේදී දියුණු තත්ත්වයක් මෙහි දක්නට ලැබේ.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# මිරිසවැටි මහ දගැබ

බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වී දසමසක් ඉක්මයෑමෙන් පසු සුද්ධෝදන පියරජුගේ අපේක්ෂාව වූ තම පුතණුවන් දැකීමේ ආශාව ඉටුකිරීම පිණිස කිඹුල්වත්පුරයට වැඩම කරවීම (පළමුවරට) සිදු වූයේ මැදින් පොහෝ දිනකය. සුද්ධෝදන රජු බුදුරජාණන් වහන්සේ දැකීමේ බලාපොරොත්තුවෙන් ඒ සඳහා සුදුසු දූත මෙහෙවරක යෙදීමට කෙනෙකු සොයා බැලීය. බුදුරජාණන් වහන්සේ උපන් දිනයේම ඉපදුන කල්‍යාණ මිත්‍රයෙකු වූ ''කළුදායි'' ඇමැතියා මේ සඳහා තෝරා ගත්තේය. පෙර දූතමෙහෙවරෙහි යෙදුණු සියල්ලෝම ධර්මය අසා පැවිදි වූහ. මේ නිසා තමන්ටද පැවිදිවීමට සිදුවන බව දැන පැවිදිවීමට අවසර ලැබෙන්නේ නම් ''දූත මෙහෙවරෙහි'' යෙදීමට හැකි බව කළුදායි ඇමතියා සුද්ධෝදන රජුට පැවසීය. තම අදහස ඉටුකිරීමට හැකිනම් පැවිදිවීමට අවසර ලබාදෙන බව රජතුමා ප්‍රකාශ කෙළේය. සතුටට පත් කළුදායි ඇමතියා පැවිදිවීමෙන් පසු කිඹුල්වත්පුරයේ ගමන් මාර්ගයක්, කිඹුල්වත්පුරයෙත් ගාථා හැටකින් (60) බුදුරජාණන් වහන්සේට වර්ණනාත්මක ලෙසින් ප්‍රකාශකර සිටියේය.



කිඹුල්වත්පුරයට වැඩම කිරීමට තීරණය කල බුදුරජාණන් වහන්සේ උපස්ථායක ආනන්ද තෙරුන් සමඟත් ද මහා සංඝරත්නය විශාල පිරිසක් සමග කිඹුල්වත්පුරය බලා පා ගමනින් වැඩම කළහ. ආනන්ද තෙරුන් අමතා ''ආනන්ද කිඹුල්වතින් එන සුළඟක් සැපද්‍රයකයයි'' වදාළ සේක. කිඹුල්වත්පුරයට වැඩමකළ බුදුරජාණන් වහන්සේ රජමාළිගාවේ දී පියරජුට දහම් දෙසා සෝවාන්ඵලයට පත්කොට තම ඥාතීන්ට දහම් දෙසූහ. මෙහිදී ඥාතීන්ගේ මානය දුරු කිරීම සඳහා ''යමාමහ පෙළහර'' පෑ බව බුද්ධ චරිතයෙහි සඳහන් වේ. මෙම අවස්ථාවට ''යසෝදරා දේවිය'' නොපැමිණියාය. පසුව ඇයගේ ගුණයන් රජතුමා බුදුරජාණන් වහන්සේ ආනඥ තෙරුන් සමග යසෝදරා දේවියගේ මන්දිරයට වැඩම කළහ. එහි දී බුදුරජාණන් වහන්සේ දුටු යසෝදරා දේවිය සතුටට පත්ව බුදුරදුන්ගේ ශ්‍රී පාදය වන්දනා කළාය. බුදුරජාණන් වහන්සේ පසුව ඇයගේ සසර තොරතුරු ද සඳහන් ''චන්දකිණ්ණර'' ජාතකයෙන් දහම් දෙසූ සේක. පසුදින බුදුරජාණන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතය සඳහා කිඹුල්වත්පුරයට (නගරයට) වැඩම කළහ. මේ බව දුටු සුදවුන් රජතුමා එතැනට පැමිණ ''තම රාජවංශයට'' නින්ද්‍ර නොකරණ ලෙස ඉල්ලා සිටියේය. එවිට බුදුරජාණන් වහන්සේ වදාළේ මෙය බුද්ධවංශයට අයත් පිළිවෙතක් වන බවයි. මෙය දුටු යසෝදරා දේවිය තම රාහුල පුතු කැඳවා බුදුරජාණන් වහන්සේගෙන් දායාද ලබාගන්නා ලෙස ප්‍රකාශ කළාය. එතැනට පැමිණි රාහුල කුමරුද බුදුරජාණන් වහන්සේ සමඟ විහාරයට ගියේය. බුදුරජාණන් වහන්සේ රාහුල කුමරුට පැවිද්ද ලබාදුන්සේක. නන්ද කුමරුගේ තෙමඟුල යෙදී තිබුණ එම දිනයේ බුදුජාණන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහන්සේලාට දන්පිළිගැන්විය.දානය අවසානයේ පාත්‍රය අතටගත් නන්ද කුමරු බුදුරජාණන් වහන්සේ සමඟ විහාරයට ගියේය. එහිදී නන්ද කුමරු පැවිදි විය. මෙම අවස්ථාවේදී සුද්ධෝදන රජතුමාට දැඩි මානසික වේදනාවක් ඇති විය.රාහුල කුමරුගේ සහ නන්ද කුමරුගේ පැවිදිවීම මෙයට හේතුවිය. දෙමව්පියන්ගෙන් නොවිමසා දරුවන් පැවිදි නොකරන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි රජතුමා එම ඉල්ලීම පිළිගත් බුදුරජාණන් වහන්සේ දෙමව්පියන්ගෙන් අවසරයක් නොමැතිව දරුවන් පැවිදි නොකරන ලෙසට ''විනය නීතියක්'' පැනවීය. මෙම සිද්ධියත් වැදගත් කරුණක් ලෙස පෝදිනට සම්බන්ධ වී තිබේ.



ඉහත සඳහන් වැදගත් සිදුවීම් රැසක් මැදින් පොහෝ දිනට සම්බන්ධ වී ඇති බව ශාසනික තොරතුරු වලින් පැහැදිලි වෙයි. ලාංකික බෞද්ධ ජනතාව මෙම උතුම් පොහෝ දි ... ස් ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවෙහි යෙදෙන බව සඳහන් කිරීමට පුළුවන.

විජය තලවත්තේගෙදර

# මැදින් පොහෝදා අසිරිය

**සම්බුදු සිරිතේ දක්නට ලැබෙන උත්තරීතර මානව ධර්ම හා උන්වහන්සේ විසින් පරමාදර්ශයෙන් පෙන්වා වදාළ මානව ශිෂ්ටාචාරයේ යහපැවැත්මට තුඩුදෙන යුතුකම් පද්ධතිය කවර සමාජයකට වුවද ඉතා වැදගත් මගපෙන්වීමක් ලබාදේ. සිඟාලෝවාද, මංගල, පරාභව වැනි සූත්‍ර ධර්ම මඟින් මේ බව තහවුරු වේ. ඤාතකානංච සංගහො" යනුවෙන් ඤාතීන්ට සංග්‍රහ කිරීම මංගල සම්මත කරුණක් ලෙස සම්මානිත නිගමනයකට පැමිණ ඇත්තේ ඥාතිත්වය යනු සදාතනික මානව ධර්මයක් ලෙස පිළිගැනීමෙනි. මැදින් පුර පසළොස්වක පොහෝ දිනය අපට සිහිපත් කරන්නේ ඥාති සංග්‍රහය පිළිබඳ බුදුන් වහන්සේගේ පරමාදර්ශයයි.**

තම පුතු අභිනිෂ්ක්‍රමණය කොට සත් වසරක් ගතවී මැදින් මස උදා වූ කල සුද්ධෝදන නිරිඳුන්ට බුදුන් දැකීමේ ආශාවක් උපන්නා. බුද්ධත්වයෙන් පසු ප්‍රථම ආරාම පූජාව ලෙස පිළිගත් මගධ රට වේළුවනාරාමයේ බුදුන් වහන්සේ වැඩ සිටින බව අසන්නට ලැබීමෙන් මහත් ප්‍රීතියට පත් සුදෝවුන් රජ බුදුන් වහන්සේ වැඩම කරවා ගැනීමට ඇමතිවරයෙකු සමඟ දහසක් පිරිස රජගහ නුවරට පිටත් කළේය. ඔවුහු බුදුන් වහන්සේගෙන් දහම් අසා රහත් බවට පත්ව පැවදි වූහ. මේ අයුරින් අමාත්‍යවරයෙකු ප්‍රධාන කොට දහස බැගින් කණ්ඩායම් නවයක්ම පිටත්කොට හැරියද ඔවුහු සියල්ලෝම බණ අසා රහත්ව පැවදි බවට පත්වූහ. අවසානයෙහි කාළුදායී ඇමති ප්‍රධාන දහසක් පිරිස දහවන පිරිස ලෙස පිටත් කළහ.

එම ගමනේදී කාළුදායී අමාත්‍යවරයා පැවදිවීමට අවසරයද රජගහනුවර වේළුවනාරාමයට ගොස් පෙර පිරිස සේම පැවිදිබව ලබා පැවිදිබව ලබා සුදුසු දින එළඹි කල්හි පිය රජතුමාගේ ඇරයුම බුදුන් වහන්සේ වෙත දැනුවත් කළහ. එය සිදුකළේ බුදුරදුන් සමීපයට ගොස් රජගහනුවර සිට කපිලවස්තු නගරය දක්වා ගමන් මග සොබා අසිරිය ගාථා කීපයකින් වර්ණනා කිරීමෙනි. කාළුදායී තෙරුන් වහන්සේ පින්බර සංවිධායකත්වයෙන් සිය ඥාතීන් දැක බලා ඔවුන් දහම් ඔසුවෙන් නිවා සනහන්නට කිඹුල්වත් නුවරට වැඩමකරන මහා අසිරිමත් චාරිකාව ඇරඹුණි.

නවම් පුර පසළොස්වක පොහෝදිනය උදාවිය. පස්වග තවුසන් පැවිදි උපසම්පදාව ලැබීමත් සමඟ ආරම්භ වූ බුද්ධ ශ්‍රාවක පිරිස මේ වන විට විසිදහසක පමණ රහතන් වහන්සේලා පිරිසකි. මේ මහා සංඝ සනනිපාතය එදා නවම් පුන් පොහෝදා කපිල වස්තු පුරයට වැඩම කිරීම ඇරඹිණි.

බුදුන් වහන්සේගේ ඥාතීන් වන ශාක්‍ය වංශික කුලවතුන් තම ඥාතීත්වය අනුව සලකා මානයෙන් යුතුව බුදු සිරිපා නොවැඳ සිටි බැවින් යමාමහා පෙළ හරකින් තත් මානය බිඳ දැමීමට උන්වහන්සේට සිදුවිය. වෙස්සන්තර ජාතකයෙන් දහම් දෙසා සුද්ධෝදන මහ නිරිඳුන් සෝවාන් ඵලයට පත්කළ අප තිලෝගුරු බුදු පියාණන් වහන්සේ ඥාති සංග්‍රහයේ උත්තරීතර බල මහිමය තිලොවටම දැනෙන සේ දේශනා කළහ.

පසුදින මෙම රාජකීය දූතයාණන් වහන්සේ ගෙපිළිවෙලින් පිඩුසිඟා වඩිමින් අසිරිමත් බුදු සිරිතේ සම්භාවනීය පිළිවෙත ආදර්ශයෙන් පෙන්වා දුන්හ. පුතනුවනි අපගේ වංශයට නිගා නොකළ මැනවි. සිඟා කෑම ශාක්‍ය වංශිකයින්ට සුදුසු නොවේ යනුවෙන් ආයාචනා කරමින් සුද්ධෝදන නිරිඳුන් බුදුහිමියන් සමීපයෙහි වැඳ වැටුණි. එවිට බුදුන් වහන්සේ, පියාණෙනි, ශාක්‍ය වංශය ඔබේ වංශයයි. මගේ වංශය බුද්ධ වංශයයි. පිණ්ඩපාතය බුද්ධ වංශයේ සිරිතකි." යනුවෙන් පිළිතුරු දුන් සේක.

එහිදී ශාක්‍ය වංශිකයින් බුදුන් ප්‍රමුඛ මහ සඟරුවනට දන් පිළිගැන්වූහ. එතැනදී දෙසූ දහම් පද අසා පියරජතුමා සකෘදාගාමී ඵලයටද පත් වූහ.

සසර පුරා බැඳි අපමණ සෙනෙහසින් පාරමිතා පූරණයට අතදුන් සොඳුරු බැඳිම යසෝදරාවන් බව සනාථ කරමින් ලොව ප්‍රථම ආදර කථාව ලෙසින් සම්මතව ඇති සඳකිඳුරු ජාතකය දේශනා කළ බුදුරජාණන් වහන්සේ යසෝදරාවන්ගේ ගුණකඳ බණ පදයක් බවට පත් කළ සේක.

කිඹුල්වතට වැඩි තුන්වනදා නන්ද කුමරුගේ පැවිදි වීමද සිදුවිය.ශාක්‍ය සිංහයානන්ගේ දේහ ලක්ෂණ හා ගමන් විලාසය පිළිබඳ නරසීහ ගාථා මඟින් ගුණ ගයා තම පුතුට පියාණන් හඳුන්වාදුන් යශෝදරාවෝ ඒ නරසිංහයාණෝ ඔබේ පියාණෝ" යැයි හඳුන්වාදුන්හ. පියාගෙන් පුතාට හිමිවිය යුතු දායාදය ඉල්ලා සිටි රාහුල කුමරු ශාසනික දායාදය හිමිකර ගත්තේ පැවිදි බව ලැබීමෙණි. මුගලන් මහා තෙරුන් වහන්සේ විසින් රාහුල කුමරුගේ කෙස් බා සිවුරු පොරවන ලදි. සැරියුත් මහ රහතන් වහන්සේ රාහුල කුමරු පැවිදි කළ අතර මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ උපාද්‍යායන් වහන්සේ වූහ.

රහල් කුමරුගේ පැවිද්දෙන් මහත් කම්පනයට පත් සුද්ධෝදන නිරිඳුන් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ මව්පියන්ගෙන් අනුදැනුමක් නොවිමසා දරුවන් පැවදි නොකළ යුතු යැයි ඉල්ලා සිටි අතර උන්වහන්සේ එය තුෂ්ණීම්භූතව පිළිගත් සේක.

සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ ඉපිද සත්දිනකින් මහාමායා දේවිය කළුරිය කොට තුසිත දෙව්ලොව උපත ලදහ. එදා සිටම උන්වහන්සේට සුළුමව වූයේ ඥාතිත්වයට වුවද සිදුහත් චරිතයට බුද්ධ මාතා වූයේ ප්‍රජාපතී දේවියයි. ඇයට දහම් දේශනා කොට සෝවාන් ඵලයට පත් කරමින් කෘතවේදිත්වය අර්ථවත් කළහ.

මැදින් පුන් පොහෝදා සිදුවූ මෙම අසිරිමත් ප්‍රාතිහාර්යාත්මක සිහිවටනයක් මගින් අපට විද්‍යාමාන වන්නේ අසිරිමත් පෙළහර නොව මානව ශිෂ්ඨාචාරයේ උත්තරීතර වූ හෘදයාංගම ලේ සුවඳක අරුමයයි.



කුරුණෑගල
විසුද්ධායන විද්‍යායතන පිරිවෙනේ
ආචාර්ය ශාස්ත්‍රපති වික්‍රමසිංහ
අතපත්තු


## මැදින් පොහොය දින වැදගත්කම



1. බුදු වී කිඹුල්වත් නුවරට වැඩම කිරීම.
2. මහා ප්‍රජාපතී ගෝතමියට ධර්ම දේශනා කිරීම.
3. ශ්‍රී පාද වන්දනාව සඳහා ජනප්‍රිය දිනය වීම.
4. නන්ද කුමරු පැවිදිවීම.
5. රාහුල කුමරුන් පැවිදි වීම.



# සිතීමේ හා විමසීමේ නිදහස



## බුදුදහමේ ශ්‍රේෂ්ඨත්වයයි

නිදහස් චින්තනයේ මුදුන් මල්කඩක් වැනි බෞද්ධ දර්ශනයේ සිතීමට හා විමසීමට ලැබෙන්නේ උසස් ස්ථානයකි. සමහර ශාස්තෘන්වරයන් තම ලබ්ධිය දේශනා කළා විනා පෙරලා ඒවා පිළිබඳව ප්‍රශ්න නැගීමට අවස්ථාව ලබාදුන්නේ නැත. සමහර ශාස්තෘවරයන් ගුරුවරයාගෙන් ප්‍රශ්න නැගීම පාපී ක්‍රියාවක් ලෙස දේශනා කර ඇත.

බුදුපියාණන් වහන්සේ දේශනා කර ඇත්තේ,

'' තථාගතප්ප වේදිතො භික්ඛවේ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡනෙනා ''
(අංගුත්තර නිකාය - තික නිපාතය)

(මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වුයේ බබලයි. වැසුනේ නොම බබලයි)

බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්ට දුන් නිදහස තරම් උතුම් වරප්‍රසාදයක් වෙනත් ශාස්තෘවරයෙකු අනුගාමිකයනට ලබා දී නැත. උන්වහන්සේ දුන් අවවාදය නම් ආත්මය, ද්වීපයක්, පහනක් කොට ආත්මාරක්ෂාවක් කොට වසව් යන්නයි. වෙන කිසිදු පිළිසරණක් නොපතම් යන්නයි. ඇතැම් ආගම්වලින් කෙරෙන්නේ මිනිසා දෙවියකුගේ හෝ ශාස්තෘවරයෙකුගේ වහලෙකු බවට පත්කිරීමයි. ගැති බවට යටත් කිරීමයි.

බුදුදහම මිනිසාට සිතීමට හා විමසීමට දොරටුව විවෘත කොට ඇති බව සූත්‍ර කීපයකින් පැහැදිලි වේ. කාලාම සූත්‍රය, විමංසක සූත්‍රය, මහා පදෙස සූත්‍රය ඉන් කීපයකි. මෙයින් කාලාම සූත්‍රයට මුල් තැන හිමිවේ. වරක් බුදුරජාණන් වහන්සේ කොසොල් රට කේස පුත්ත නැමැති නියම් ගමට වැඩම වූ කළ කාලාම නමින් ප්‍රසිද්ධව සිටි මිනිසෙකු උන්වහන්සේ කරා පැමිණ මෙසේ පවසා ඇත.

භාග්‍යවතුන් වහන්ස, මේ නියම් ගමට කලින් කළ බුද්ධිමත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පැමිණෙති. ඔවුහු ම තමන්ගේ මතවාද ප්‍රකාශ කෙරෙති. අනුන්ගේ මතවාද හෙළා දකිති. එයින් කවරෙක් සත්‍ය පවසත්ද, කවරෙකු අසත්‍යවාදීහු වෙත්දැයි අපි බලවත් සැකයට විමතියකට මුහුණ පා සිටිමු. බුදුන්වහන්සේ කාලාමයනට මෙසේ පිළිතුරු දුන් සේක.

''එථ තුමෙහ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය මා පිටක සම්පදානේන, මානක්කහෙතු, මා හය හේතු, මා ආකාර පරිවිතක්කේන, මා දිට්ඨි නිර්ඣාන ඛන්තියා මා භබ්බ රූපකාය, මා සමනො නො ගරුති යදා තුමෙහ කාලාමා අත්ත නාම ජානෙය්‍යාථ ඉමෙ ධම්මා අකුසලා ඉමෙ ධම්මා සාවජ්ජා ඉමෙ ධම්මා සවනතා සමා දින්නා අහිතාය දුක්ඛාය සංවත්තනිති''

කාලාමයෙනි,

1. යම් අදහසක් ඵේදයෙහි එන නිසාහෝ

2. පරම්පරාවෙන් එන නිසා හෝ

3. මෙසේ වන්නට ඇතැයි අනුමානයෙන් හෝ

4. තමාගේ පිටකයෙන් එන සම්ප්‍රදායයන්ට සමානයැයි පෙනුමෙන් හෝ

5. තමන් දන්නා කියන දෙයට අනුකූලය යන පෙනුමෙන් හෝ

6. තමන් දන්නා න්‍යායයට අනුකූලයැයි කියා හෝ

7. මතුපිට ආකාරය හොඳය යන පෙනුමෙන් හෝ

8. තමන් පිළිගත් දෘෂ්ඨියට එකඟය යන ආකාරයෙන් හෝ

9. පුද්ගල ගෞරවය නිසා හෝ

10. මොහු අපගේ ගුරුවරයා යන ගුරු ගෞරවය නිසා හෝ නොපිළිගන්න.

මේ දහම් අකුසල්ය. මේ දහම් වාද සහිතය. මේ ධර්මය බුද්ධිමතුන් විසින් ගර්හිතය. මේ දහම් පිළිගැනීම අහිත පිණිස දුක් පිණිස පවතී යයි යම් අවස්ථාවක ඔබටම වැටහේ නම් එහිදි අත්හරින්න, බැහැර කරන්න.

ඉහත දේශනයෙන් බෞද්ධ දර්ශනය තුළ විමසීමට කොතරම් නිදහසක් ඇද්ද ස්වාධීන චින්තනයට කොතරම් ඉඩ සලසා ඇද්ද යන කාරණය මනාව ස්ඵුට වෙයි.

මැදුම් සඟියේ විමංසසා සූත්‍රයේදි මෙසේ ද වදාරා තිබේ. ශ්‍රාවකයන් විසින් තථාගතයන් වහන්සේ පවා විමසා බැලිය යුතුයි. ශාස්තෘවරයා සම්‍යක් සම්බුද්ධ ද නැද්දැයි වටහා ගත හැක්කේ එසේ විමසා බැලීමෙනැයි පැවසූහ.

> "තථාගතප්පවේදිතො භික්ඛවේ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡනෙනා "
> (අංගුත්තර නිකාය - තික නිපාතය)
>
> (මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වුයේ බබලයි. වැසුනේ නොම බබලයි)

මෙවැනි ශ්‍රේෂ්ඨ වචනයක් අන් කිසිම ශාස්තෘවරයෙකු ගේ මුවින් පිටවූයේ නැත. යම් අදහසක් පිළිබඳව නිගමනයකට බැසීමේ තවත් ක්‍රමයක් අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ මහා පදේශ සූත්‍රයෙන් දක්වේ.

එහිදී පෙන්වා දී තිබෙන්නේ,

01. යමෙකු තමා බුදුන් වහන්සේ වෙතින් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි යමක් ඉදිරිපත් කළත් - බුධාපදේශ

02. යමෙකු තමා අසවල් විහාරයේ සංඝයාගෙන් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි ඉදිරිපත් කළත් - සංඝාපදේශ

03. යමෙක් යමක් අසවල් විහාරයේ බොහෝ භික්ෂූන්ගෙන් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි ඉදිරිපත් කළත් - සම්බහුල ථේරාපදේස

04. යමෙකු යමක් අසවල් විහාරයේ ධර්මධර විනයධර උගත් භික්ෂුවකගෙන් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි යමක් ඉදිරිපත් කළත් - එකථේරාපදේස

එය එක්වරම පිළිගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් නොකොට එය සූත්‍ර විනය දෙක හා සසඳා ගැලපේ නම් පමණක් පිළිගැනීමටත් නොගැලපේ නම් ප්‍රතික්ෂේප කිරීමටත් අවස්ථාව සලසා තිබේ.

යම් අදහසක් පිළිබඳව යථාර්ථය තේරුම් ගැනීමට උපයෝගීවන කරුණු හෙවත් උපදේශ 4ක් බුද්ධඝෝෂ හිමියන් විශුද්ධි මාර්ගයේ දක්වා තිබේ. එනම්,

සූනත, සුත්තානුලොම, ආචරියාවාද, අත්තනොමති යන කාරණා සතරයි. යමෙකු යම් කරුණක් ඉදිරිපත් කළ විට එය සූත්‍රයක දක්නා ලැබේද නොලැබේද සූත්‍රයට අනුලෝමද නැද්ද ආචරියාවාදයට අනුකූලද නැද්ද තමාගේ මතයට ගැලපේද නැද්ද කියා විමසීමෙන් අනතුරුව පිළිගැනීම නිවැරදි බව එහි දක්වා තිබේ.

මේ ආකාරයට සිතීමේ හා විමසීමේ නිදහසට බෞද්ධ දර්ශනය තුළ ඇත්තේ සුවිශේෂී තැනකි. එය බුදුදහමේ ශ්‍රේෂ්ඨත්වයයි.

**ශාස්ත්‍රපති රුවන් ජයවීර**

කුරුණෑගල විසුද්ධායන විද්‍යායතන පිරිවෙණේ ආචාර්ය ශාස්ත්‍රපති, සාම විනිසුරු වික්‍රමසිංහ අතපත්තු විසිනි.

# සැප විඳින්නට, සුව ලබන්නට

# බොදු වත් පිළිවෙත්



**සෑම සත්ත්වයෙකුගේම අපේක්ෂාව හා බලාපොරොත්තුව සැපසේ ජීවත් වීමයි. දුක යටපත් කොට සැප වැළඳගෙන සුබෝපභෝගී ජීවන රටාවකට සිහින මවන පුහුදුන් මිනිසා සදාකාලිකවම සැරිසරන්නේ සැබෑ ලොවක නොව මවාගත් මනෝ ලෝකයකයි. බුදු දහම සැපය පිළිබඳව දක්වන ආකල්පය කුමක්දැයි විමසා බලමු. ප්‍රාග් බෞද්ධ භාරතීය සමාජයේ ආත්ම විමුක්තිය උදෙසා පිළිවෙත් දෙකක් නිර්දේශ වී තිබුණි. එනම්,**

අත්ත කිලමතානු යෝගය
කාම සුබල්ලිකානු යෝගය
යනුවෙන්

ඉගැන්වෙන දුකින් සැප සෙවීම හා සැපෙන් සැප සෙවීමේ පිළිවෙතයි. මෙම ප්‍රතිපත්ති දෙකම බැහැර කොට පැහැදිළි ඉගැන්වීම් ක්‍රමයක් බුදු සමයෙන් හඳුන්වාදෙයි. එය මැදුම් පිළිවෙතයි. පෘථග්ජන ලෝකයා සැපය යන්නෙන් අදහස් කරන්නේ පසිඳුරන් පිනවීම නම්වූ ලෞකික සුවයයි.

"*සුඛ කාමානි භූතානි*" සියළු සත්ත්වයෝ සැප කැමති වෙති.

"*දුක්ඛ පටික්කුලා*" දුක පිළිකුල් කරති. බුදු දහමට අනුව සැප පිළිබඳව විවිධ ප්‍රභේද හඳුනාගත හැකිය. එයින් එක් ඉගැන්වීමක් ලෙස දිට්ඨ ධම්ම සුඛ හා සම්පරායික සුඛ දැක්විය හැකිය.

මෙලොවදී ලබන සැප දිට්ඨධම්ම සුඛ යන්නෙන් අදහස් වෙයි. ලෞකික ජීවිතය සුවදායක කරගත යුතුය. දුක්ඛිතව අසරණව, නිවට නියාලුව, පරාජිතව විසිය යුතු නොවේ. මෙලොවදී ලැබිය යුතු සුවපත්භාවය මෙලොව සැප පිණිස හේතු වෙයි.

සම්පරායික සුඛ යනුවෙන් දැක්වූ පරලොව සැප සඳහා මෙලොවදී ලබන මානසික සුව සහනය බෙහෙවින් ඉවහල් වෙයි. කුසල පක්ෂයේ සංකල්පනා සමග තුන්දොර හසුරුවා ජීවන සහනය උදාකරගත් පුද්ගලයා අනිවාර්යයෙන්ම සම්ප්‍රදායික සුවය ලබන්නේය. එහෙත් පරලොව සැප පතා මෙලොව දුක් විඳිය යුතුය යන්න යන ජෛන ඉගැන්වීම් ඇතැම් බෞද්ධයෝද අනුගමනය කිරීමට පෙළඹී ඇත. අනාගතයේ සැප විඳිනු පිණිස දුක් මහන්සි වී අලස නොවී ඉගෙන ගැනීම, ධනය හරිහම්බ කිරීම ආදී වෙහෙස මහන්සි වීමේ බෞද්ධ දර්ශනයට එකඟය.

ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ මෙලොව සැප උදෙසා පිළිවෙත් හතරක්ද පරලොව සැප උදෙසා පිළිවෙත් හතරක්ද දේශනා කොට වදාළහ. එයින් උට්ඨාන සම්පදා හෙවත් උත්සාහ සම්පත්තියත් ආරක්ඛ සම්පදා හෙවත් ආරක්ෂා සම්පත්තියත් කල්‍යාණ මිත්තතා හෙවත් යහපත් මිත්‍ර ආශ්‍රය හා සමජීවිකතා හෙවත් සමබර ජීවන පැවැත්ම මෙලොව සැප සම්පත් උදාකර දෙන ක්‍රමවේදයන් හතරකි.

සද්ධා සම්පදා, සීල සම්පදා, ත්‍යාග සම්පදා, පඤ්ඤා සම්පදා ලෙස ශ්‍රද්ධාව, සීලය, පරිත්‍යාගය හා ප්‍රඥාව ගැන බුදුන් වහන්සේ පෙන්වා පරලොව සැපත සහතික කරන උදාරතම ක්‍රමවේදයක් හැටියටයි. බුදු දහම සැප පිළිබඳව සිදු කරන විග්‍රහයන් වලදී ලෞකික සැප හා ලෝකෝත්තර සැප යනුවෙන් පැහැදිලි බෙදීමක් සිදුවී ඇති බව අපි දකිමු. පසිඳුරන් පිනවා කායිකව හා මානසිකව තෘප්තිමත් වීම ලෞකික සැපයයි. ගිහිසැප පැවිදි සැප ලෙස කරන ලද බෙදීමට අනුවද ගිහිසැප අයත් වන්නේ ලෞකික සැප අතරටයි. කාමභෝගී සමාජය ලෞකිකත්වයේ උපරිමය මායාවක් හා මුලාවක් බව නොදන අධි සුඛෝපභෝගී ජීවන ක්‍රමයකට තරඟ කිරීමෙන් දහසක් සමාජ ගැටළු උද්ගතව පවතී. මූලික අවශ්‍යතා ඉක්මවා ගිය අසීමිත ආසාවන්ගෙන් වත්මන් සමාජය අතෘප්තිකර මාවතක අතරමංවී තිබේ. සැබෑ නොවන සිහින රැසක පැටලී සිටින ඔවුන් යන්තමින් හෝ මුදවාගත හැක්කේ ලෝකෝත්තර සුවය පිළිබඳ අවබෝධය තුළිණි.

පැවිදි සැප තුළ ඇත්තේ ගිහිගෙයින් නික්මී පැවිදි බව ලැබීම මගින් සිතට දැනෙන නොබැඳිබව නිසා දැනෙන නිවහල් සුවයයි. රැස් කරන්නට හෝ ආරක්ෂා කරන්නට වස්තුවක් නොමැතිකමින් සිතට දැනෙන සැහැල්ලුකම ප්‍රඥා නුවණ වර්ධනය කර ගැනීමට කදිම තෝතැන්නකි. ලෝබ-දෝස-මෝහ යන අකුෂල මූලයන් සිත යටපත් කොට පාලන බලය සියතට ගන්නේ රැකිය යුතු බාහිර සම්පත් වල තරමටය. රුපියලක අයිතිය තහවුරු කිරීමට ඇති ලෝභ-දෝස-මෝහ ශක්තිය රුපියල් දාහක ධනයකදී දහස් ගුණයකින් වැඩිවෙයි. සැප විඳනවාට වඩා ධනය රැකීම පිළිබඳ වෙහෙසීමෙන් රැස්වෙන අකුසල සම්භාරයන් මෙලොව පරලොව ආත්මීය උරුමයන් පරිහානිය කරා පමුණුවාලයි.

පැවිදි සැපය තුළ මෙම ජයග්‍රාහී පසුබිම මැනැවින් ගොඩනගා ගත හැකිය. රැස් කිරීමෙන් ලැබෙන විපත වෙනුවට අස් කිරීමෙන් ලැබෙන සැපත පැවිදි උතුමන්ගේ උරුමයකි.

අංගුත්තර නිකායේ අණන සූත්‍රයට අනුව මෙලොවදී ලැබිය හැකි සැප හතරකි.

**අත්ථි සුඛ**
**භෝග සුඛ**
**අණන සුඛ**
**අනවජ්ජ සුඛ**
යනුවෙනි.


මා විසින් දැහැමිව උපයාගත් ප්‍රමාණවත් වස්තු සම්පත්තියක් ඇතැයි සිතට දැනෙන පරිපූර්ණ හැඟීම අත්ථි සුඛයයි. ධනවතුන් බොහෝ දෙනා මට ධනය ඇතැයි සිතා සෑහීමකට පත්ව තෘප්තිමත් නොවෙති. අධිතෘෂ්ණාවෙන් යුතුව ධනේෂ්වර සංකල්ප වලින් පීඩිතව නොනවතින ගමනකට වැටී වෙහෙසෙති. සත්‍ය වශයෙන්ම එතැන අත්ථි සුඛය යටපත් වෙයි. මට ධනය ඇත යන අදහස තුළින් තෘප්තිමත් විය හැක්කේ ලද දෙයින් සතුට ගොඩනගාගත හැකි ශ්‍රේෂ්ඨයෙකුට පමණි. අත්ථි සුඛය පෙර පිනටම පමණක් පහළවන සැපයක් නොවේ. එය උත්සාහය හා උනන්දුව තුළින්ද ගොඩ නගාගත හැකි සම්පතකි.

භෝග සුඛ යනුවෙන් හඳුන්වන්නේ තමා සතු ධනය මැනවින් පරිහරණය කිරීමට හා භුක්තිවිඳීමට ලැබී ඇති අවස්ථාව අනුව සතුටු වීමයි. අධික මසුරුකම නිසාද ලෝබයෙන් ධනය රැස්කර ගෙන වියපත්ව මිය යන මසුරු සිටාණන් වැනි තැනැත්තන් සමාජයේ සිටිති. ධනය ඇතත් නිසි කළමණාකරණයක් නොමැතිව ඒවා විනාශ වී යන අවස්ථාද පවතී. අත්ථි සුඛයෙන් අර්ථවත් කළ **"මට ධනය ඇතැයි"** සිතා සොම්නස් සහගතව ප්‍රීතිමත් ජීවිතයක් ගතකරන ගිහි සමාජයට භෝග සුඛය තුළින් ආත්ම වින්දනයක් උදාකර ගත හැකි බව බුදු සමයේ පැහැදිළිව උගන්වා ඇත.

අණන සුඛ නම් ණය නැතිව වාසය කිරීමේ සතුටයි. අද පවතින තරඟකාරී ආර්ථික ක්‍රමය තුළ බොහෝදෙනා ජීවත්වන්නේ ණය බරින් යුක්තවයි. නිවාස ඉඩකඩම් ආදිය උගසට තබා සින්නවන අවස්ථාද දක්නට ලැබේ. ණය වී හිතේ නිදහස හා සැහැල්ලු බව විනාශ කර ගන්නා වත්මන් සමාජය අණන සුඛයෙන් දුරස්ව කල් ගෙවයි. ආදායමට සරිලන වැයක් පවත්වාගෙන යාමත් සැහැල්ලු දිවි පැවැත්මට හුරුවීමත් අත්‍යාවශ්‍ය දේ පමණක් මිලට ගැනීමත් චාම් දිවි පෙවෙතට හුරු පුරුදු වීමත් අණන සුඛය රැක ගැනීමට හේතුවේ.අනවජ්ජ සුඛ යනු නිවැරදි බව තුළින් දැනෙන තෘප්තියයි. වැරදිකරුවන් නීතියට වහන් වී කෙතරම් සැප අනුභව කළත් චිත්තාභ්‍යන්තරයේ ඔවුන් කළ වැරදි පිළිබඳ මතක සටහන් නිවි නිවී දැල්වී පවතී. ඉන් ඇතිවන පශ්චාත්තාපය හා මානසික අසහනය ඇති වේ. සාර්ථක මිනිසෙක් මෙලොවදී ලබන සැපය නම් තම නිරවද්‍යතාවය ගැන සිතට දැනෙන ආත්ම තෘප්තියයි. බෞද්ධ ඉගැන්වීම් අනුව මෙවැනි සැප ලබමින් එන සංසාර ගමනේ අවසානයට ලබාගත හැකි සැපය වන්නේ නිර්වාණ සුවයයි. "නිබ්බානං පරමං සුඛං" නිවණ පරම සැපතයි. ඉහත කී සියලු සැප වේදයිත හෙවත් විඳිනු ලබන සැප ලෙස සැලකේ. නිවන පමණක් අවේදයිත හෙවත් නොවිඳින සුවයක් ලෙස සැලකේ. නොවිඳින්නේ නම් එය සැපයක් වන්නේ කෙසේද? විඳීම තුළ ඇත්තේ දුක අරමුණු කරගත් තෘෂ්ණාවක පහළ වීමයි. (වේදනා පච්චයා තණ්හා) තෘෂ්ණාව සැමවිටම දුකට ප්‍රත්‍යයකි. එබැවින් සියලු විඳීම් අවසන් කොට නොවිඳිනා තැනකට සිත ගමන් කරවිය හැකිනම් එතැන ඇත්තේ නිවනයි. නිවන උතුමම සැපය වන්නේ ඒ නිසාය.

# සිඟාලෝවාද සූත්‍රය පෙන්වා දෙන

# හිත-මිතුරු සබඳතා



***"මිතුරු තුමෝ දුක සැප
දෙකෙහිම පැවතී
බිතු සිතුවම් රූ මෙන් පිටු නොපා විතී"***

ඉහත සඳහන් උධෘතය විශිෂ්ඨ සිංහල සාහිත්‍යධරයෙකු වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ලියූ 'සැළලිහිණි සංදේශයෙන්' උපුටා ගත්තකි. ඒ මෙම ලිපියට එය ඉතා යෝග්‍ය යැයි මා හට හැගී ගිය හෙයිනි. එහි සඳහන් ආකාරයට 'උතුම් මිත්‍රයන් දුක සැප දෙකෙහිම සැමදා ලගින් සිටින බවත් ඒ කොයි අයුරින් ද කිවහොත් එකම ලෙසින් වෙනස් නොවී සිටින බිත්තියක ඇදි සිතුවමක් ලෙසටය. එවන් උතුම් මිතුරන්ගෙන් ඉටු විය යුතු යුතුකම් හා වගකීම් සම්බන්දව දූන සිටීම, හදුනාගෙන තිබීම ඉතා වැදගත් වන්නේය.

බුදු රජාණන් වහන්සේ එවන් උතුම් මිතුරන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් මිතුරාගෙන් මිතුරන්ටද, මිතුරන් විසින් මිතුරාටද වශයෙන් දෙපිරිසටම යුතුකම් හා වගකීම් පහ බැගින් සිගාලෝවාද සූත්‍රයේ දී දේශනා කර ඇති අතර, එහිදී හිත මිතුරන් බුදුරජාණන් වහන්සේ උතුරු දිශාවට සමාන කර ඇත. උන් වහන්සේ වදාළ ආකාරයට යහපත් මිතුරෙකු විසින් තම විතුරන්ට ඉටටු විය යුතු යුතුකම් පහක් සහ එසේ උපකාර ලබන මිතුරන් විසින් තම මිතුරාට ඉටුකල යුතු යුතුකම් පහක් දේශනා කර ඇත. මිතුරකු තතම මිතුරන්ට ඉටු කළයුතු යුතුකම් ලෙස,

1.මිතුරාට අවශ්‍ය දේ දීම. (දානේන)

2.ප්‍රිය වචනයෙන් කතා කිරීම. (පෙය්‍ය වජ්ජේන)

3.දියුණුව සඳහා කටයුතු කිරීම. (අත්ථ චරියාව)

4.සමානාත්තමතාවය දක්වීම. (සමානත්තතාය)

5.නොරැවටීම. (අවිසංවාදනතාය)

යන කරුණු දූක්විය හැකිය.

එහි සඳහන් ආකාරයට මිතුරන්ට දානයෙන් සංග්‍රහ කළ යුතුය. මිතුරන්ට අවශ්‍යම දෙයක් තමා සතුව ඇත්නම්, එය තමාට දිය හැකි නම් මිතුරන්ට යහපතක් වන දෙයක් නම් එය ලබාදීම තුළින් මිතුරන්ට තම යහලුවා කෙරෙහි ඇති ඇල්ම තවත් වැඩි වෙයි. වර්තමානයේ මෙය වරදවා තේරුම් ගන්නා නිසාවෙන් මිතුරන් අතර ගැටුම් ඇති වීමටද බොහෝ දුරට ඉඩ ප්‍රස්ථාව ඇත.

ඒ වාගේම ප්‍රිය වචනයෙන් මිතුරන්ට ඇමතීමද යහපත් මිත්‍රයෙකු විසින් කළ යුතුය. තිරිසන් සතුන් පවා ප්‍රිය වචනයට ඉතා කැමැත්තක් දක්වයි. එයද අද වනවිට මිතුරන් අතරින් ඈත් වී යන සෙයක් දක්නට ලැබේ. අසා සිටින්නෙකුට පවා අප්‍රිය වචනයෙන් ඔවුනොවුන් අතර පවා කථා බව සිදු වන්නේ නම් එය කෙතරම් අසංවරද? බුදුන් වහන්සේ හිත මිතුරු සබදතාවන් අතරින් ප්‍රිය වචනයෙන් මිතුරන් යහපත් බව දේශනා කර ඇත්තේ ඉන් ඇති වන සෙත ශාන්තිය දූන සිටි නිසාවෙනි.

මිතුරන්ගේ පිරිහීමට කටයුතු කරන යහලුවන් අද වන විට සමාජයේ බහුලවෙමින් පවති. නමුත් එය නොසිදු විය යත්තකි. මිතුරන්ගේ දියුණුව සඳහා කටයුතු කිරීම යහපත් මත්‍රයෙකුගේ යුතුකමක් බුදුන් වහන්සේ දේශනා කොට ඇත්තේ එම නිසාය. එසේම සමානාත්මතාවය සහ මිතුරන් කිසි දිනෙක නොරැවටීම උතුම් මිතුරෙකු සතු යුතුකමකි. තමාගේ දුක සැප දෙකෙහිදී ලගින් සිටින තම මිතුරන්ට මෙලෙස උදව් උපකාර කිරීම තුළින් එම මිතුරාට යමපතක් මිස අයහපතක් සිදු නොවන බව නොඅනුමානය. මෙසේ සංග්‍රහ ලැබීමටත් එම මිතුරන් කළණ මිතුරන් විය යුතුය. කළණ මිතුරු ඇසුර තුළින් පමණක් මෙම යුතුකම් හා වගකීම් නිසිපරිදි ඉටු වන බව නම් කිවයුතුමය.

මෙසේ මිතුරාගෙන් සත්කාර ලබන මිතුරන් විසින්ද තම මිත්‍රයාට ඉටු කළ යුතු යුතුකම් පහක් බුදුන් වහන්සේ දේශනා කර ඇත. ඒවා නම්,

**1.දුසිරිතෙහි වැටී ප්‍රමාද වූ මිතුරා ආරක්ෂා කර ගැනීම.** (පමත්තං රක්ඛංන්ති)

**2.එබදු මිතුරාගේ වස්තුව ආරක්ෂා කර දීම.** (සාපතෙය්‍යංරක්ඛන්ති)

**3.බියට පත් වූ මිතුරා ඉන් මුදා ගැනීම.** (භීතස්ස සරණං හොන්ති)

**4.විපතට පත් මිතුරා අත් නොහැරීම.** (ආපදාසුන විජහන්ති)

**5.මිතුරාගේ අඹුදරුවන් ආදීන්ට සැළකීම.** (අපර පජාවස්ස පටිපුම්ජන්ති)

ලෙස දූක්විය හැකිය.

අපට දක්නට ලැබෙන්නේ වර්තමාන සමාජයන් තුළින් යහපත් මිත්‍රයන් ලෙස පෙනී සිටිමින් තම මතුරාට අයහපතක් සිදු කිරීමට නිතර පෙළඹෙන මිතුරු කණ්ඩායම්ය.

ඉහත දක්වූ ආකාරයට මිතුරාගෙන් සංග්‍රහ ලබන විට මිතුරන් විසින් මිතුරා දුසිරිතෙහි වැටී ඇත්නනම් ඔහු දුසිරිතට ගැනීමට කටයුතු කිරීමට යුතුකමකි. ඒ වගේම එය මහා පුණ්‍යකර්මයකි. ඉන් එම මිතුරාට සහ ඔහුගේ පවුලේ දූ දරුවන්ට, බිරිදට ඥාතීන්ට පවා මහගු සෙතක් සැළසෙනු ඇත. ඒ අන්දමට කටයටටුතු කරන අතරම ඔහුගේ වස්තුව ආරක්ෂා කර දීමද මහගු යුතුකමකි. එසේම තම මිතුරා යම් කිසිවිටක බියට පත් වුවහොත් ඔහු ඉන් මුදා ගැනීමටද මිතුරන් පෙළඹිය යුතුය. මිතුරාට යම් අසනීපයක්, සොර සතුරු බියක් වැනි කුමකින් හෝ ඔහුගේ සිත සනස, ඔහුව ආරක්ෂා කර ගත යුතුබව බුදුන් වහන්සේ දේශනා කර ඇත. මිතුරා යම් බියකට පත් වුවහොත් ඔහු අත් නොහැර ලගින් සිටිය යුත්තේ උතුම් මිතුරන් සතු යුතුකමක් ලෙසිනි. එයට උදාහරණයක් ලෙස පන්සිය පනස් ජාතක පොතේ එන චුල්ල හංස ජාතකය පෙන්වා දිය හැකිය.


එහි හංස සේනාවය නායකයා මානස නම් විලෙහි ඇටවූ උගුලකට හසු වූ කල්හි ඔහුගේ මිත්‍ර වූ සුමුඛ නම් හංස සේනාධිපති මිතුරා අත් නොහැර ගියේ මිත්‍ර ස්නේහය වැඩි නිසාවෙන්ය. එදා විපතට පත් මිතුරා අත්නොහැර සිටියේ තිරිසන් සත්වයෙකි. එසේ නම් උසස් මනසක් සහිත වූ මිනිසත් බව ලැබූ අපටද ඒ උතුම් ගුණය සිදු කළ හැකි නොවන්නේද? උතුම් මිත්‍රයන් කිසිම විටෙක තම මිතුරා විපතට පත් කළ අත්නොහැර අසලින්ම සිටී. මිතුරන්ගේ අඹුදරුවන් ආදීන්ට සැළකීමද මිතුරන් විසින් කළ යුතු යුතුකමක් ලෙස බුදුරදුන් වදාළ සේක. මිතුරාගේ දුක සැප දෙකේදීම ලගින් සිටිමින් ඔහුගේ අඹු දරුවන්ට පවා නිසි අන්දමින් සැළකිලි දක්විය යුතුය.

මේ අන්දමට බුදුරජාණන් වහන්සේ අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් අතර හිත මිතුරු සබදතා වලට විශේෂ ස්ථානයක් ලබා දුන් බව පෙන්ව දිය හැකිය. හිත මිතුරු අතර අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර කර ගැනීම තුළින් ඔවුනොවුන් අතර විශ්වාසයද ඉතා හොදින් ඇතිවේ. මේ අන්දමට සැම පුද්ගලයෙකු විසින්ම තමා සතු යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු වන්නේ නම් සමාජයක් කෙතරම් සුන්දර වන්නේද? බෞද්ධයාගේ අවසාන පැතුම වන්නේද කළණ මිතුරු ඇසුර පැතීම සහ බාල මිතුරු ඇසුරින් ඈත් වීමයි. එම පැතුම මල්පල ගැන්වෙන්නට මෙම යුතුකම් හා වගකීම් එකිනෙකා අතර නිසි පරිදි ඉටු වීම ඉවහල් වනු ඇත. ඒ අන්දමට පවිටු මිතුරු ඇසුරකින් තොර යහපත් මිතුරු ඇසුරක් ඇති දූහැමි සමාජයකට ආසිරි අපිදු ඉත සිතින් පතන්නෙමු.

**එස්.දිල්රුක්ෂි අබේකෝන්**

යොවුන් සිතට දහම් දැනුම

# දියුණුවන්නෙකු තුළ දක්නට ලැබෙන ලක්ෂණ



බුදුරජාණන් වහන්සේ කරණීය මෙත්ත සූත්‍රය මගින් දියුණුවන්නෙකු තුළ තිබිය යුතු ලක්ෂණ පහළොවක් දක්වා තිබේ. ශිෂ්‍යයෙකු නම් එම ජීවිතය සාර්ථකකර ගැනීමටත්, වැඩිහිටියෙකු නම්, ඔහුගේ ජීවිතය සාර්ථකකර ගැනීමට හේතුවන එම කරුණු පහළොව මෙසේය.

**සක්කෝ ගුණය.**
**(හැකියාවක් ඇත්තෙකු වීම)**

ශිෂ්‍ය ජීවිතයක් ගත කරන්නෙකුට වුවත්, වැඩිහිටි ජීවිතයක් ගත කරන්නෙකුට වුවත්, කිසියම් වගකීමක් ඇත්තේය. තම සතු වූ එම වගකීම නිවැරදිව ඉටු කිරීම, මෙයින් අදහස් කෙරේ. මට බැහැ යන්න දුරුකර, මට පුළුවන්, යන්න සිතේ දරාගෙන කටයුතු කිරීම ඉතා වැදගත්වන බව මෙයින් ප්‍රකාශ වන අර්ථයයි.

**උජු ගුණය.**
**(අවංක වීම)**

කිසිවෙකුටත්, යටත් නොවී සාධාරණත්වය ඉටු කිරීමට කටයුතු කිරීම, මෙයින් අදහස් කෙරේ. සතර වැදෑරුම් අගතියට නොගොස් කටයුතු කිරීම මෙහි අර්ථය වේ.

**සූජුච ගුණය.**
**(අවංකව සෑම හැනදීම ක්‍රියා කිරීම)**

වචනයෙන්, සිතුවිල්ලෙන්, ක්‍රියාවෙන් ඇද නැති බවයි. යම් තීරණයක් ගැනීමේ දී යුක්ති සහගතව එය සිදු කිරීම.

**සුවච ගුණය.**
**(කීකරු වීම)**

යහමග පෙන්වාදෙන, දෙමව්පියන්ට, ගුරු හවතුන්ට, වැඩිහිටියන්ට, කීකරුවීම මෙයින් අදහස් කෙරේ. තමන්ගේ දෙලොව දියුණුවට දෙනු ලබන අවවාද පිළිගැනීම, මෙයින් ලබාදෙන පුළුල් අර්ථය වේ.

**මුදු ගුණය.**
**(දර දඬු නොවීම)**

රළු ගති පැවැතුම් ඇති නොවී මෘදු මොළොක් ගති, පැවැතුම් යුක්තවීම මෙයින් අදහස් කෙරේ.

**අනතිමානී ගුණය.**
**(ආඩම්බර නොවීම)**

තමාට හිමි නිලය හෝ ධනය ගැනසිතා අනුන් පහත් කොට සලකා සිතමින් ක්‍රියානොකිරීම මෙයින් ප්‍රකාශවන තේරුමයි.

**සන්තුස්සක ගුණය.**
**(ලද දෙයින් සතුටු වීම)**

තමාගේ උගත්කම, දැනුම, ක්‍රියාකාරීත්වය අනුව ලැබුණු තනතුර ප්‍රමාණවත්යැයි සිතා සිත සතුටු කර ගැනීම. තමා ලැබෙන සම්පත් ගැන සෑහිමට පත්ව ක්‍රියාකිරීම, මෙයින් අර්ථවත් කෙරේ. දකින්නට ලැබෙන දේ තමා විසින්ම ලබාගත යුතුයැයි නොසිතා ලද දෙය ගැන සෑහිමකට පත්වීමයි.

**සුභර ගුණය.**
**(පහසුවෙන් පෝෂණය කළ හැකි බව)**

ආහාරපාන, ඇඳුම්, පැලඳුම්, කොපමණ තිබුණත් එයින් සතුටටපත් නොවී තව තවත් ඒවා පසු පස හබායන අය සිටිති. එවැනිතත්වයෙන් මිදී සෑහීමකට පත්වීම සුභර ගුණයයි. පහසුවෙන් පෝෂණය කිරීමේ හැකියාව, මෙහි විස්තර කරන ගුණයයි.

**අප්පකිච්චෝ ගුණය.**
**(වැඩ කටයුතු අඩු අයෙකු වීම)**

තමාගේ ප්‍රමාණයට (ගැලපෙන) වැඩ කටයුතු යොදාගෙන ඒවායෙහි යෙදීම මෙම ගුණයයි. කාර්යය බහුලත්වයෙන් ඇත්ව තමන්ට දරා ගැනීමට හැකි ප්‍රමාණයට වැඩ කටයුතු කිරීමෙන් මෙලොව ජීවිතය සාර්ථක වේ.

**සල්ල හුක චුත්ති ගුණය.**
**(සැහැල්ලු පැවැත්මෙන් යුක්ත වීම)**

බාහිර ආටෝපයන්ගෙන් ඈත්ව චාම් ලක්ෂණයන්ගෙන් යුක්තවීම, මෙයින් අදහස් කෙරේ. චාම් දිවි පැවැත්ම සිතට සැනසිල්ලක්ම ගෙන දෙයි.

**සන්තින්ද්‍රිය ගුණය.**
**(සන්සුන් ඉඳුරන් ඇති බව)**

පස් වැදෑරුම් ඉඳුරන් පාලනය කරගෙන ජීවත්වීම මෙයින් ප්‍රකාශවේ. ඉන්ද්‍රියන්ගේ සන්සුන්බව හේතුකොට සිතේ තැන්පත් බවක් නිරායාසයෙන්ම ඇතිවේ. එය දියුණුවට හේතුවේ.

**නිපක ගුණය.**
**(නුවණැති වීම)**

ජීවිතයක් සාර්ථක වන්නේ, නුවණින් ක්‍රියාකලවිටය. සෑම කටයුත්තකදීම තම නුවණ මෙහෙයවා නිවරදි පිළිවෙලට පත්වීම. මෙයින් අදහස් කෙරේ. මෙලොව හා පරලොව සාර්ථක ජීවිතයට මෙය තදින් බලපායි.

**අප්පගබ්භ ගුණය.**
**(තැන්පත්කමෙන් යුක්ත වීම)**

අන්‍යයන්ට හිරිහැර, කරදර නොවන පරිදි කටයුතු කිරීම මෙම ගුණයයි. තැනට උචිත ආකාරයට තම හැසිරීම් සිදුකලයුතු බව මෙයින් කියවේ.

**කුලේසු අනනුගිද්ධ ගුණය.**
**(කුලයන් කෙරෙහි ඇලුම් නොකිරීම)**

මෙම ගුණය අදාල වන්නේ භික්ෂූන් වහන්සේලාටය. තම දායක පවුල් සමග ප්‍රමාණයට වඩා මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම නොකලයුතු බව මෙයින් ප්‍රකාශ වේ. එය භික්ෂු ජීවිතය පිරිහීමට හේතුවන බව එමගින් විස්තර වේ.

**නවකුද්දන් සමාචරෙ ගුණය.**
**(නුවණැති අය දොස් නගන කුඩා වරදක්වත් නොකර සිටීම)**

එක් අවස්ථාවක සිදු වූ වරදක් යලි යලි සිදු නොවීමට ක්‍රියාකිරීම මෙයින් විස්තර වේ.

මෙසේ විස්තර වන්නාවු කරුණු පුද්ගලයාගේ දියුණුවට හේතුවන්නක් බව මෙම සූත්‍රය ඇසුරෙන් ඉගැන්වෙන අතර, ඒවා පිළිනොපැදීම පිරිහීමට ද හේතුවන බවත් සඳහන් වේ.

චිත්‍රා දිසානායක
පොල්ගහවෙල

# බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වන්නේ කුමක් සඳහාද?



ලොව්තුරා බුදු කෙනෙකුන් ලොව පහළ වන්නේ ලෝකයා එතෙක් කරගෙන යන කටයුතු වලට උදව් කිරිමට නොවේ. තවත් කෙනෙකුට කළ නොහැකි බුදුරජාණන් වහන්සේ නමක් විසින්ම කළ යුතු බුද්ධ කාර්යයන් සඳහාය. බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළවීම ඉතා දුර්ලභ කරුණකි. (බුද්ධුපස්දොව දුල්ලභො) යන්නෙන් එය පැහැදිලි වේ. බුදුරජාණන් වහන්සේ නමක් බුද්ධත්වයට පත්වීමෙන් පසුව උන්වහන්සේ විසින්ම කළ යුතු බුද්ධ කාර්යය මැනවින් ඉටු කරයි. ඒ ලෝකයාට අනුකම්පා පිණිසය.

මෙම කරුණ මෙසේ සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්නේ නම් කරුණු 05ක් යටතේ මේ පිළිබඳව සඳහන් කළ හැකිය.

01. බුදෙධා සො භගවා මබාධාය ධම්මං දෙසෙති (බුද්ධත්වයට පැමිණි බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ අවබෝධය පිණිස දහම් දෙසන සේක)

02. දනෙනා සො භගවා සමථාය ධම්මං දෙසෙති (දමනයට පත් බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ දමනය පිණිස දහම් දෙසන සේක)

03. සනෙතා සො භගවා සමථාය ධම්මං දෙසෙති ( නිවීමට පත් බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ නිවීම පිණිස දහම් දෙසන සේක)

04. හිණෙනනා සො භගවා තරණාය ධම්මං දෙසෙති (සසරින් එතෙර වූ බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ එතෙරවීම පිණිස දහම් දෙසන සේක)

05. පරිනිබබුතො සො භගවා පරිනිබ්බුතාය ධම්මං දෙසෙති (පිරිනිවීමට පැමිණි බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ පිරිනිවීම පිණිස දහම් දෙසන සේක.

මෙම කාරණා පහට අනුව ඉහත සඳහන් පළමු කාරණාව වන්නේ බුද්ධත්වයට පත් බුදුරජාණන් වහන්සේ ලෝකයාට අවබෝධ පිණිස දහම් දේශනා කරන බවය. බුදුකෙනෙකුන් ලෝකයාට හෙළි කරන මූලිකම ඉගැන්වවීම නම් චතුරාර්ය සත්‍යයයි. සූත්‍ර දහස් ගණනක් උන්වහන්සේ විසින් දේශනා කලද ඒ සැම සූත්‍රයකින්ම අපේක්ෂා කරනු ලබන්නේ චතුරාර්ය සත්‍යය සඳහා මඟ පාදා දීමයි. තමන් වහන්සේ ලඟට දහම් ඇසිමට පැමිණෙන්නා වූ පිරිසට උන්වහන්සේ මැනවින් අවබෝධ වන ලෙස ධර්මය දේශනා කළහ. කවදා උන්වහන්සේ විසින් ඔවුන්ට දහම් දේශනා කළ ක්‍රම හතරක් පිළිබඳව මෙසේ දැක්විය හැකිය.

**01. ඒකංස ව්‍යාකරණීය**
**02. පටිපුච්ඡා ව්‍යාකරණීය**
**03. විභජ්ජ ව්‍යාකරණීය**
**04. ඨපනීය ව්‍යාකරණීය**

වශයෙනි.

මේ අතරින් ඒකංස ව්‍යාකරණීය යනු අසන පැනයට එක එල්ලේම පිළිතුරු ලබාදීමයි.

පටිපුච්ඡා ව්‍යාකරණීය නම් ප්‍රති ප්‍රශ්න නගමින් දහම් දේශනා කිරීමයි. ප්‍රශ්නකරු වෙත ඊට අදාල වෙනත් ප්‍රශ්න ඉදිරිපත් කරමින් ඒවාට ලැබෙන විසඳුම් අනුව පිළිතුරු ලබාදීම මේ අනුව සිදුකෙරේ.

විභජ්ජ ව්‍යාකරණීය යනු ප්‍රශ්න කොටස් වලට බෙදා විග්‍රහ කොටසට වෙන් වෙන් වශයෙන් පිළිතුරු සැපයීමයි.

ඨපනීය ව්‍යාකරණීය යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඉවතලන ප්‍රශ්නයයි. ප්‍රායෝගික වශයෙන් ජීවිතයට එතරම් වැඩකට නැති ප්‍රශ්න උන්වහන්සේ විසින් ඉවත් කරමින් දහම් දේශනා කරයි.

මේ අයුරින් දහම් දේශනා කිරීමේදී පුද්ගලයාට මැනවින් දහම් අවබෝධ කරගත හැකිවේ.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්ය සත්‍ය තුළින් කෙනෙකු හඳුනාගනු ලබන්නේ දුක නැමැති ගැටළුවයි. මෙකී දුක නම් වූ ගැටළුව පුද්ගලයා කුමන නායක උත්පත්තිය ලැබුවද ඒ භවය වෙනස් කරගැනීමෙන් නැතිකරගත හැකි දෙයක් නොවේ. බොහෝ අය දුකෙන් නිදහස් වීම වෙනුවට දුක් විඳීම සිදුකරති. බුදුරජාණන් වහන්සේගේ බුද්ධ වචනයෙන් පෙන්නුම් කරන්නේ දුක් විඳීම නොව දුකෙන් නිදහස් වීමයි. එයින් නිදහස්වීමට නම් සැබෑ ලෙසින්ම දුක අවබෝධ කළ යුතුය. බොහෝ පිරිස් මේ ජීවිතය දුකයි. දුකයි යනුවෙන් සඳහන් කලද දුක යන්න කුමක්ද කියා ඒ පිළිබඳ අවබෝධයක් නැත. ඒ නිසාම දුකෙන් ගැලවෙනවා වෙනුවට දුක් වැවීමට අවශ්‍ය කරන දෙය හැමවිටම සකස් කරන බවක් පෙනෙයි. ලෝභ, ද්වේශ, මෝහ කියන්නා වූ අකුසල මූල ධර්මයන් සිත තුල පුරවාගෙන තණ්හා, ආශා, වෛරයෙන් යුක්තව බොහෝ දෙනෙක් ජීවත්වීමට උත්සාහ දරති. කිසිවෙකුත් අත්හැරීම ජීවිතයට හුරු කරන බවක් නොපෙනේ. තමාගේ සිත තුල ආශා හෙවත් තණ්හාව තිබෙන තාක් කල් දුක නැති කිරීමටත් ඒ තුලින් හටගන්නා වූ බිය නැතිකිරීමටත් නොහැකි බව බුදුරජාණන් වහන්සේ මේ අයුරින් දේශනා කරයි.

**තණ්හාය ජායතී සෝකෝ**
**තණ්හාය ජායතී භයං**
**තණ්හාය විප්පමුත්තස්ස**
**නත්ථි සෝකෝ කුතෝ භයං**

**(තණ්හාව නිසා ශෝකය හටගනී. තණ්හාව නිසා බිය හටගනී. තණ්හාවෙන් මිදුන පුද්ගලයාට කුමන ශෝකයක්ද, කුමන බියෙක්ද?)**

බුදුරජාණන් වහන්සේ මෙම දුක්ඛ සත්‍යය අවබෝධ කරගත්තේ කෙනෙකුගෙන් අසා දැනගෙන නොවේ. පෙර නොඇසූ විරූ තැනකින් අවබෝධ කරගත් බව උන්වහන්සේ පළමු සූත්‍ර දේශනාවේදීම දේශනා කර තිබේ. (පුබෙබ අනනුසසුතෙසු ධම්මෙසු) පෙර නොඇසූ දෙය වටහා ගැනීමට කලින් පෙර ඇසූ දෙය තේරුම්ගත යුතුය. එනම් ඇස, කණ, නාසය, දිව, ශරීරය යන මෙම ඉන්ද්‍රිය පහ ඇසුරු කොට යම් දැණුමක් අවබෝධයක් කෙනෙකු ලබා ගන්නේ නම් එය පෙර ඇසූ දැනුමයි. ඇසට පෙනෙනවා යැයි සැළකුවාට ඇසට නොපෙනෙන දෙය නම් යමක යථාභූත ස්වභාවයයි. කණට ඇසෙනවා යැයි ප්‍රකාශ කලත් නොඇසෙන දෙය නම් යථාභූත ස්වභාවයයි.

මේ ආකාරයට බැලූ කල අප සතු ඉන්ද්‍රියන්ට ඇසෙනවා. දැනෙනවා යැයි ප්‍රකාශ කලත් ඒ කුමන ඉන්දියකවත් යථාභූත ස්වභාවය නොපෙනේ. එනිසා පෙර ඇසූ දෙය හෙවත් මේ ඉන්ද්‍රිය ඥාණය සැබෑ ලෙසින්ම දුක අවසන් කිරීමට ප්‍රමාණවත් නොවේ. බුදු කෙනෙකු ලොව පහළ වූ විට අන්ධයන්ට පෙනීමටද, බිහිරන්ට ඇසීමටද ගොළුවන්ට කථා කිරීමටද හැකියාව ලැබෙනවා යැයි කීම ඥාණවන්ත මිනිසාට මෙමගින් වටහාගත හැකිය. අද සැපයි හොඳයි කී දෙය පසුව නරකයි, දුකයි යනුවෙන් නිතර මේ දැණුම වෙනස් වන්නේ මේ ඉන්ද්‍රිය ඥාණය තුළ තිබෙන දුර්වලකම නිසාය. මේ ලොව කුමන හෝ දියුණුවක් ලෞකිකව ලබා තිබෙන්නේ නම් මේ ඉන්ද්‍රිය ඥාණය එයට ප්‍රමාණවත්ය. තථාගතවැරන් ලොව දෙස බලන්නේ ප්‍රඥාවෙනි. ප්‍රඥාව මෙම ඉන්ද්‍රිය ඥාණය ඉක්මවා පවතී.

මුලින් කී කරුණු අතර දෙවැනි කාරණය නම් (දමනයට පත් බුදුරජාණන් වහන්සේ ලෝකයාගේ දමජය පිණිස අනුශාසනා කරන බවයි. මෙහි දමජය නම් ඉන්ද්‍රිය අරමුණු විෂ යෙහි නොඇලී, නොගැටී, නොමුලාව වාසය කිරීමයි. පෘථග්ජනයා වරින්වර අරමුණුවල ඇලීමද, ගැටීමද, මුලාමද සිදුවේ. එනිසා ලෝභයද, ද්වේශයද, මෝහයද හට ගනී. මේවා නැතිකර ගැනීම පිණිස බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසරක් මුළුල්ලේ සත්වයාට අනුශාසනා කළ සේක.

පූජ්‍ය ඇරැවුල පේමානන්ද හිමි

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## බුදුහිමි අනුදත් මඟ අනුගමනය කරන්නෝ කවුරුන්ද?

සම්බුද්ධ ජයන්ති වසර තවම නිමා වී නැත. එහි තේමා පාඨය වූ පිළිවෙතින් පෙළ ගැසෙමු යන්නද තවම මැකී ගොස් නැත. එසේ තිබියදී සමාජ ආර්ථික හා සාමාජ හා දේශපාලනික කාරනාවන් බුදුහිමි අනුදත් මඟ අනුගමනය කරන්නෝ කවුරුන්ද? පිළිතුර කිසිවෙකු නැත යන්නය.

වෛරය අවෛරයෙන්ද සතුරු බව මිත්‍රත්වයෙන්ද ප්‍රචන්ඩත්වය ධර්මානුකූලවද විසදා ගත යුතු අයුරු ත්‍රිපිටකය පුරාම ලියවී ඇත්තේය. ධම්ම පදයේද ජාතක පොතේද තවත් බොහෝ ධර්ම ග්‍රන්ථ වලද මේ පිළිබඳව ධර්ම කරුණු බෝහෝ විස්තර වෙයි.

එහෙත් ඒවා පිලිපදින සමාජයක් අපට දැක ගත නොහැකිය.

මෑත භාගයේ සිදුවූ බොහෝ ගටුම් අර්බුධ හා මතවාද හමුවේ මෙරට මහජනයා කටයුතු කළේ මහත් ආවේග ශිලිවය. විප්ලව කාරීවය. උද්ඝෝෂණ ශීලිවය. ගිහියන් මෙන්ම ඇතැම් භික්ෂු සංඝයාද ප්‍රචන්ඩව හැසිරුණු අයුරු ජන මාධ්‍ය මඟින් දැක ගතහැකි විය. ඒවා මෙරට පමණක් නොව පිටරටවලද නැවත නැවත ප්‍රචාරය විය.

එමඟින් බුද්ධ ශාසනයට මෙන්ම ශ්‍රී ලංකාවේ කීර්ති නාමයටද මහත් හානි ගෙන දේ.

දැන් දැන් පාසල් ළමුන් හා දහම් පාසල් හා පෙර පාසල් ළමුන්ද උද්ඝෝෂණ පිකටින් වලට සහභාගි කර ගන්නා අයුරු දැකගත හැකිය. මෙය නම් මහා විපතකි. නොසිදුවිය යුත්තකි.

රාජ්‍ය පාලනය රාජ තාන්ත්‍රික භාවය, අන්තර්ජාතික ගැටුම් මෙන්ම ජන සමාජයේ ඇතිවන සියලු ආකාරයේ අර්බුධයන්ට විසඳුම බුදු දහමේ මනාව සඳහන්ය. එහෙත් එකී ධර්ම කරුණු භාවිතයට ගැනීමක් හෝ විමසා බැලීමක් හෝ සිදුවනු දැක ගත නොහැක. නායක කාරකාදීන් බලධාරීනට, විද්වතුන්ට ඒවා පෙන්වා දීම ගරුතර මහා සංඝරත්නයේ යුතුකමකි. නොඑසේනම් අපසමාජය දිනෙන් දින පරිහානියට පත් වීම අඛණ්ඩව සිදුවනු නියතය. සමාජ සංස්ථා බිඳ වැටීමත් රටදැය සමය තර්ජනයට ලක් වීමත් එහි අතුරු ප්‍රතිපලයන්ය.

ධර්මධර විනයධර භික්ෂූන්ගේත් උගත් බුද්ධිමත් විදුවතුන්ගේ සහභාගීත්වයෙන් රටපුරා ආගමික ප්‍රබෝධයක් ඇති කිරීම නොපමාව කළ යුතුය. ශ්‍රී ලාංකීය ජන සමාජය හරහා අධිවේගයෙන් හමා යන අසංවර අධිවේගී බටහිර සංස්කෘතියට යම් වැට බැඳීමක් කළ යුතුය.

බුදු සම්දුන් දෙසූ සර්ව කාලීන ශ්‍රී සත්ධර්මය ගමක් ගමක් පාසා ගෙයක් ගෙයක් පාසා ලංකාව පුරාම පතුරවා ලිය යුතුය. ඊට, පන්සල, වෙහෙර, විහාරය, ආරාමය, අසපුව, ලෙන, කුටිය, ආදී සියළු ස්ථාන එක් විය යුතුය. එසේ නොවුව හොත් කෙටි කලකින්ම ලංකාව පිළිබඳව සෝචනීය සිදුවීම් නිතර අසන්නට දකින්නට අපට සිදුවනු නිසැකය.

බුදු සසුනට බුදු දහමට හානි වෙත්නම් ලෝක විනාශයද එයමය. සුනාත, ධාරේඨ, ෂරාඨ, යන උතුම් බුදුවදන සිහියට ගෙන මංමුළා නොවී ශීල, සමාධි, ප්‍රඥා වඩමින් කටයුතු කර රටත් දැයත් සමයත් ඔබත් රැකෙණු පිණිස නුවණින් කටයුතු කළ යුතුව ඇති බව සැමට සිහිකර සිටිමු.

# ගෞතම සම්බුදුපියාණෝ ප්‍රවේණි වංශ චාරිත්‍රයට ගමන් ඇරඹූ මැදින් පුන් පොහොය



මැදින් මස පුර පසළොස්වක පොහොය දිනය සම්බුද්ධ ශාසන ඉතිහාසයේ අතිශය උදාර දිනයකි. ඒ උදාරත්වයට හේතුවන සුවිශේෂි කරුණු දෙකකි.

1. සම්මාසම්බුදු රජාණන් වහන්සේ සම්බුද්ධත්වයෙන් මාස දහයක් සම්පූර්ණ වන දින පිය මහරජතුමන් ප්‍රමුඛ ඥාතීන්ට ධර්ම දේශනා කිරීම සඳහා කිඹුලුවතට වැඩීම.

2. බුද්ධත්වයෙන් වසර පහක් පමණ ඉක්මෙන මැදින් පුන් පොහෝ දින ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු 500ක් රාජ කුමාරිකාවෝ පැවැද්ද අපේක්ෂාවෙන් ගමන් ඇරඹීම.

ඉහත කරුණු දවස හේතුවෙන් බොහෝ සත්වයාට සෙත ශාන්තිය සැළසුනි. දස දහස් සත්වයෝ අමාමහ නිවන් දුටහ.

බෝසතාණන් වහන්සේ ගිහිගෙය හැරපියා ගොස් සකළ ක්ලේෂයන් දුරුකළ බැවින් අතීතයේ වූ සියළු බැඳීම් සිඳහල ද පුත්‍ර ස්නේහයෙන් පිඩිත වූ සුඩෝවුන් මහරජතුමා සිය පුතු අද අද වඩීවි යැයි සිතා පෙරමඟ බලා සිටියේය.

එහෙත් සිදුහත් කුමරු ගිහිගෙයින් නික්ම වසර 7කට ද ආසන්න විය. බුදුරදුන් වඩමවාගෙන ඒම සඳහා නව වරකදී ඇමතිවරු නව දෙනෙක් පිරිස සමඟ පිටත් කළද ඒ සියළු දෙනා පැවදි වූවා මිස බුදුරදුන් රැගෙන නොවැඩියහ.

දසවෙනි වතාවට සිදුහත් කුමරු හා එකදින උපන් කළුදායි අමාත්‍යවරයා අමතා පුත කළුදායි, මා පුතු හමුවට ගොස් සුඩෝවුන් මහරජාණන් පුතු නොදැකීමේ ශෝකයෙන් පසුවන බව පවසා කෙසේ හෝ මාපුතු කැඳවාගෙන එවයි" කීය.

මහරජාණන් වහන්ස, පැවිදි වන්නට අවසර දෙන්නේ නම් පැවදිව සම්බුද්ධ පියාණන් ද වැඩමවා ගෙන එන්නෙමි" ය කළුදායි ඇමති පැවසීය.

සුඩෝවුන් මහරජතුමාගේ අවසරයෙන් සම්බුද්ධ හිමියන් එවකට වැඩසිටි රජගහ නුවර වේළුවනාරාමයට ගිය කළුදායි ඇමති ප්‍රමුඛ පිරිස ලොව්තුරා සම්බුදුන්ගෙන් ධර්මය ශ්‍රවනයෙන් පසු එහිභික්ඛු" ප්‍රවෘජ්ජාවෙන් මහණ උපසම්පදාවී මහරහත් භාවය ලැබීය.

පොරොන්දු ඉටු කිරීම මහා සත්පුරුෂ ගුණාංගයකි. ලෝකෝත්තර සුවයෙන් සුවපත් වූ කළුදායි මහරහතන් වහන්සේ සුදුසු කාලය බලා වස්සානය උදාවූ මැදින් පුර පසළොස්වක පොහොය ඉදිරියේ තිබියදී සම්මා සම්බුදුරජාණන් වහන්සේ වෙත වැඩමවා, රජගහ නුවර වේළුවනාරාමයේ සිට කිඹුල්වතට වඩින මාර්ගය පිළිබඳවත්, සුඩෝවුන් රජමාළිගය පිළිබඳවත්, සුඩෝවුන් රජතුමාගේ ඉල්ලිම පිළිබඳවත් ගාථා 60 කින් වර්ණනාත්මකව දේශනා කළේය.

මෙම ආරාධනයෙන් පසු සර්වඥතා ඥනයට සමවැදී බුදුපියාණෝ පෙරත් සම්බුදුවරු ප්‍රවේණි වංශ චාරිත්‍රය" ඉටුකර ඇති බව දැක දෙපාර්ශවයේම ඥාතීන්ට ධර්මයෙන් සංග්‍රහා කිරීම පිණිස විසිදහසක් රහතන් වහන්සේලා පිරිවරා සැට යොදුනක් මඟ ගෙවා කිඹුල්වතට වැඩම කිරීම ආරම්භ කළේ මැදින් පුර පසළොස්වක පෝය දිනකදීය. මෙම වැඩමවීමෙන් ලැබුණ ප්‍රතිඵල අනන්තය.

1. මානයෙන් යුක්ත වූ ශාක්‍යයන්ගේ මානය බිඳීම.
2. සම්බුදු පියාණෝය යමහාමහ ප්‍රාතිහාර්ය පෑම.
3. සුඩෝවුන් රජතුමා සිය පුතුට තුන්වන වැඳුම වැඳිම.
4. සුඩෝවුන් රජතුමා ඇතුළු ශාක්‍යයන් මාර්ගඵල අවබෝධ කරගැනිම.
5. වෙස්සන්තර ජාතකය දේශනා කිරීම
6. සුඩෝවුන් රජතුමා ප්‍රමුඛ ශාක්‍යයන බුදුන් ප්‍රමුඛ සංඝයාට නිග්‍රෝධාරාමය පූජාකොට අටමහා කුසලයක් සිදු කර ගැනිම.
7. සුඩෝවුන් රජතුමාට බුද්ධ වංශය" පැහැදිළි කොට උටඨාන වීර්යයත්,නොපමාවෙහි අගයත්, ධර්මයේ හැසීරිමත් ආදී දහම් දෙසා සෝවාන් ඵලයෙහි පිහිටු විම.
8. නන්ද රාහුල ආදී කුමාරවරුන් පැවදි කරවා අමාමහ නිවනට පැමිණ වීම.
9. ශාක්‍ය කෝලිය යුද්ධය ඇති වීමට ඉඩ නොදී දෙපාර්ෂවයටම ධර්මාවබෝධය ලබා දී පන්සියයකට අධික පිරිස මහණ උපසම්පදා කරවා නිවනින් සැනසීම.
10. දෙමාපියන්ගේ අනුදැනුමෙන් පමණක් කුල දරුවන් පැවිදි කිරිමට විනය නීතියක් පැනවීම.
11. බුද්ධත්වයෙන් වසර පහක් ගතවෙන මැදින් පුන්පොහෝ දින එදා සෝවන් ඵලයෙහි පිහිටි මහා ප්‍රජාපතී ගෝතමී දේවිය ඇතුළු පන්සියයක් රාජ කුමාරිකාවෝ මහණකම ඉල්ලා විශාලා මහනුවර කූටාගාර ශාලාව වෙත ගමන් ඇරඹීම.
12. ඒ හේතුවෙන් එදා මෙදා තුර කාන්තාව මෙලොව පරලොව ලෞකික ලෝකෝත්තර සැනසීම ලැබීම.
13. මෙහෙණි සමාජය ආරම්භ වීම නිසා ශ්‍රී සම්බුද්ධ ශාසනයේ සිව්වනක් පිරිස සම්පූර්ණ විම.
14. බුදුරජාණන් වහන්සේ ලබාදුන් කාන්තා නිදහස මෙහෙණි සමාජය ආරම්භ වීමෙන් යථාර්ථවත් විම.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ කිඹුල්වතට වැඩමවිම හා මෙහෙණි සමාජය ආරම්භ වීමට අදාළ මුලික පියවර තැබීම හේතුවෙන් ඉහත සඳහන් සියළු ප්‍රතිඵල නෙලා ගැනීමට හැකිවිය. මේ සියළු යහපත් කාර්යයන්ට මූලිකත්වය ලද මැදින් පුන් පොහාය බෞද්ධ ජනතාවට අතිශයින්ම වැදගත් වන්නේය.

පූජ්‍ය වත්තේගම
කුසලධම්මා මෙහෙණිය.

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

# මගේ පුතුට........

වන මලින් ගෙනෙන මඳ නල
ගෙන එන්නෙද මේ සිතට සැනසුම
හිම කොදෙව් තුළින් ඇදෙන නිල්දිය
පෙන දිදී රඟයි නොදැන මං පෙන

හිරු අවර ගිරින් නැගෙයි ලොවකට
එය අලුත් දිනකි පුතේ සත්නට
බැසයන හිරු නැගෙන හිරක් ලෙසට දුටුවට
හිරු එනතයි අපියි පුතේ යන්නේ දුවදුව

වෙනස් වේවී ගලා හැලෙන අපේ ලෝකයේ
දෙමාපියන් හිරු සඳු ලෙස සිටී හැම දිනේ
මව් කෙනෙකුගේ අගය දැනුන දිනක මගේ පුතේ
පෙනී ඉන්න මා වෙනුවෙන් ස්ත්‍රී පරපුරේ

පාරේ තොටේ බස් රථ වල යනෙන හැම දිනේ
ඇයට නිදහසක් තිබේද කුරිරු ලෝකයේ
හිංසා, පීඩන දූෂණ හැම තැනේ
නුඹ වෙන්වී රැකවරණය වෙන්න සෑම දිනේ

එන්.එස්.මධුවන්ති
රත්නපුර.




## අපේ ඉස්කෝලේ

ජාතික ඇඳුම ඇඳ ගත්තු
ලොකු සර්ගේ අභිමානය
අත රැදුණු වේවැලට අවනතව
හද්දා පිටිසර ගමක පරපුර
සරසවියට අවනත කළ,
අඩිවේගී නොවූ මල් මාවත දිගේ
කුරුල්ලන්ට ඔච්චම් කර කර
අපි ගියපු ඉස්කෝලේ
ගමේ ගුරු මෑණියන්ගේ
සාරියේ තිබූ සැවැන්දරා සුවඳට
ඉවකර දණ ගහගෙන හිටපු
කටපාඩම් බැරිවෙච්ච පංතිය
අපට ජීවිතේ කියාදුන් අකුරු තොටිල්ල
පන්ති කාමරය වැහිලා
 ගේට්ටුව විතරක් කැඩිලා
හරක් රැනක් ඇතුල් වෙන අපූරුව
අන්න බස් පාර අයිනේ
පාට පාට ඉස්කෝල කඩයක් ඇරිලා
ඉංග්‍රීසියෙන් උගන්වනවා
සනුහරේටම වැරදිච්ච පාඩම......

වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර

## අමිල නිමල සෑසි පියේ...

අන්න බලන් ගඟන
තලෙන්
සරා සඳේ රැස්
පෙරුණා...
බුදු කරුණා අමා ගඟුල
දුක් සෝ සිඳ රැළි
නැගුණා...

වසත් සමේ දහස් ගණන්
සුවඳ සුමුදු මල් පිපුණා...
මුණි සිරිපා පියුම වටා
ඒ මල් දෝතින් පිදුණා...

අමිල නිමල සෑසි පියේ
දෙසූ දහම් පද අසනා...
දුකින් තැවුන මා හදවත
පියුමක් සේ පුබුදු වුණා...

එම්. සිරිධම්මාචාර
මෙහෙණින් වහන්සේ
පොල්පිගම

## තුන්සිත

දෙතොලේ නෙක පාට උලා
නන් දොඩවන
මුව කුමටද.......
පෝය දාට සිල් ගන්නා
දුක නොදන්න
සිත කුමට ද.....
උදේ හවා බෙහෙත් ගිලින
වයසට යන
කය කුමට ද ......
ලොවෙ වැඩක් නැතිව ගෙවන
ඔබෙ මිනිසත් බව
කුමට ද.......

භාග්‍යා එම් හේරත්
කැකිරාව

## ජය සිරිමා බෝධී....



අපමන ලෝ සත
සසරින් ගලවා
නිවනට මඟ පෑදූ
නොපමාවී වැඳ
දොහොත් මුදුන්දී
තිලෝ අඟ මෑනී සාදූ
ලුම්බිණි සල් උයනේදී
බිහිවී
වෙසගේ පුන් පෝදා
පැවසී මුලු ලොව
අගතැන් වෙන බව....
ලොවටම වැඩ සාදා
දස මාර සේනා බිඳ
පලවාහැර
ජය සිරිමා බෝධී.........

ඩබ්. එම්. පී. විජේසිංහ
ගල්නෑව

## වස්සානය

තෙලි තුඩට හසුවුණු
සිත්තමක්
සේ.....
නුඹ වාගේම හිනැහෙයි....
දිය කෙලින පුංචි මාළුවෝ
රමණීය වන ගැබෙහි.....
සන්නාලියනේ......
කෙසේනම් ඇන්දාද....
දේදුන්න.... අහස්කුස.....?
ගිම්හානයේ කෂව ගිය
ගංගාව......
වස්සානයේ.....
නුඹ නැවත පිරිපුන්ය....
ජීවිතය කටුක යැයි කියා
නො අතහැර යන්න....
හෙට දවස
ජීවත් කරන්නට....

අමාලි රුවන්තිකා
ඇහැලියගොඩ


## දයාබර දියණිය

ඔබේ ලස්සන දෙනෙත
දුටුදා සිට
මවක ලෙසින් ලද
සතුට....
සදා ලැබෙන්නට
සංසාරය පුරා
වේවා ඔබ මගේ
දියණියම....



හිමාලි

## කඩුපුල් මල්..........



# රංගිරි දඹුලු රජමහ විහාරය



## පසුගිය කලාපයෙන් සාරාංශය

දඹුල්ල වැනි අනුරාධපුරයෙන් තරමක් දුර බැහැර වූ ලෙන් ඇති තැන් ගැන සැලකිල්ල යොමුවූයේ අනුරාධපුරයට සමීප ප්‍රදේශවල ලෙන් විහාර භික්ෂු සංඝයාට පිදීමෙන් පසු අලුත් තැන් සොයා ගැනීමේ අවශ්‍යතාව පැන නැගුණ කාලයක යයි සිතීම අනුචිත නොවේ. දේවානම්පියතිස්ස ගෙන් පසු ඔහුගේකනිටු සොහොයුරන් කීපදෙනෙක් ම රජ බවට පත්වූහ. මෙයින් තුන්වැන්නා වූ සූරතිස්ස (සුවණ්න පිණ්ඩ තිස්ස) අන්හැම සොහොයුරකුටම වඩා බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කළ බව මහාවංශය ඔහු ගැන කරන විස්තරයෙන් පෙනේ. වංසකථාව අනුව මේ රජු ලංකාද්වීපය පුරා තැනින් තැන විහාරාම පන්සියයක් කරවීය.

සියදෙටු සොහොයුරාගේ කීර්ති කදම්බයෙන් වැසී යාම නිසාදෝ මේ රජුගේ සත්කාර්යයන් කෙරෙහි නූතන උගතුන් එතරම් සැලකිල්ලක් දක්වා නැත. සූරතිස්ස විසින් කරවූ විහාර අතර අනුරාධපුරයෙන් දකුණුදිග නගරංගණ විහාරයත් පෙරදිගින් වූ හත්පීක්ඛන්ධ (වර්තමාන කුරුණෑගල ඇත්කඳ විහාරය) ගොණ්ණගිරි (හැඳිනගෙන නැත) විහාරය සහ අච්ඡගල්ල විහාරයත් වැදගත් තැනක් ගනී. තවත් විහාරයක් නම් අරිට්ඨපාදයෙහි (රිටිගල සමීපයෙහි) මංගුලක විහාර විහාර (මෙය ද හැඳිනගෙන නැත) යයි. කෙසේ වුවද වංසකථාවෙන් මෙන්ම එහි ටීකාව වූ වංසත්ථප්පකාසියෙන් ද පෙනෙන්නේ අනුරාධපුරයෙන් දුර බැහැර පෙදෙස්වල විහාරාරාම කරවීම සූරතිස්ස රජුගේ කාලය වන විට කාලීන අවශ්‍යතාවක් වූ බවයි. අවාසනාවකට මෙන්ම තිස්ස නමින් ප්‍රකට වඩා කීර්තිමත් රජුන් (නිදර්ශක දේවානම්පියතිස්ස, සද්ධාතිස්ස වැනි) නිසා "තිස" යන පුද්ගල නාමයෙන් එන එක ද බ්‍රාහ්මී ශිලා ලිපියක් හෝ සූරතිස්ස නමින් හැඳින ගැනීමට උත්සාහ දරා නැත. මේ නිසාම එම රජු විසින් කරවූ හෝ කරවීම ආරම්භ කළ වෙහෙර විහාර හැඳින ගැනීම ද අපහසු තත්වයකට පත්වී ඇත.

සූරතිස්ස විසින් කරවූ විහාර අතුරෙන් අච්ඡගල්ල විහාරය මෙහි දී වැදගත්ය. දඹුලු විහාරයේ ඉතිහාසය සම්බන්ධයෙන් එම විහාරස්ථ භික්ෂූන් වහන්සේලා අතර එන ජනප්‍රවාද අනුව එය එක්තරා වකවානුවක දී හැඳින්වූයේ අච්ඡගල්ල හෝ අච්ඡගිරි නමිනි. විහාරය සම්බන්ධ ලිඛිත මූලාශ්‍ර කිසිවක මෙම නම සඳහන් නොවූ පමණින් ම මෙම ජනප්‍රවාදය පදනම් රහිත එකක් ලෙෂ බැහැර කිරීම සුදුසු නැත. ඉහතින් දැක්වූ පරිදි සූරතිස්ස විසින් කරවූ අච්ඡගල්ල විහාරය පිහිටා තිබුණේ අනුරාධපුරයට නැගෙනහිර දිගිනි. මෙම අච්ඡගල්ල විහාරය ඒ වන විට අනුරාධපුරයෙන් දකුණු දිගින් දේවානම්පියතිස්ස රජු විසින් කරවා තිබූ අච්ඡ නම් විහාරයෙන් වෙසෙසා දක්වනු කැමති වූ නිසාම වංශකථා කතුවරයා විසින් "පුරිමාය අච්ඡගල්ල" යනුවෙන් පැවසූ බව ටීකාකාරක වංසත්ථප්පකාසිනි කතුවරයා පවසයි.

මෙහි දී සැලකිය යුත්තේ දේවානම්පියතිස්ස විසින් අනුරාධපුරයට දකුණු දිගින් කරවූ අච්ඡ විහාරය මෙන්ම සූරතිස්ස විසින් අනුරාධපුරයට නැගෙනහිර දිගින් කරවූ අච්ඡගල්ල විහාරයත් නිශ්චිත ලෙෂ හඳුනාගෙන නැති බවය. පුත්තලම් දිස්ත්‍රික්කයේ තෝනිගලින් සොයා ගත් ලිපි දෙකක සඳහන් වන්නේ "ගමණි අභය" නම් මහරජකු විසින් "අවගරික පවත" නම් විහාරයක භික්ෂූන් වහන්සේලාට ගම්වර දෙකක් පිදූ බවත්, එම විහාරයටම පරුමක අභයගේ පුත් පරුමක තිස විසින් වැවක් පිදූ බවත්ය. මෙම අච්ඡගිරි විහාරය වට්ටගාමිණී අභය රජු ද්‍රවිඩයන්ට විරුද්ධව සටන් වැදී පරාජිතව සිටින අවස්ථාවේදී ආගමික උත්සවයක් පැවැත්වූ අච්ඡගල්ල විහාරය ලෙෂ හැඳින ගන්නා මහාචාර්ය පරණවිතාණ ලිපිවල සඳහන් ගමණී අභය අනෙකකු නොව වට්ටගාමිණී අභයම බව පවසයි. මෙම අවගිරි පවත හෝ අච්ඡගල්ල විහාරය අසුවල් තැන යයි මහාචාර්ය පරණවිතාන විසින් හඳුනාගෙන නැති අතර, වට්ටගාමිණී අභය පුවතේ එන අච්ඡගල්ල විහාරයේ රෝහණයේ එන එකක් ලෙසඔහු නොයෙක් තැන දී පලකොට ඇත. පැරණි ලංකාවේ ස්ථාන නාම හැඳින ගැනීමට උත්සාහයක් දැරූ සීතඩබ්ලිව්.නිකොලස් විසින් ද පවසා ඇත්තේ වට්ටගාමිණී අභය පුවතේ එන අච්ඡගල්ල විහාරය රෝහණ ජනපදයේ වුවක් බවය. මේ හැඳිනගැනීම් එකක්වත් නිවැරදි නොවන බව අපගේ අදහසයි. වට්ටගාමිණී අභය අනුරාධපුරයෙන් පලා ගියේත් සැඟවී සිටියේත් පුත්තලම් දිස්ත්‍රික්කයේ හෝ රෝහණයේ නොව මලය දේශයේ බව වංශකතා හැම එකක්ම පැහැදිලිවම සඳහන් කරන බැවිනි. සූරතිස්ස විසින් අනුරාධපුරයට නැගෙනහිර දිගින් කරවූ අච්ඡගල්ල විහාරය අනෙකක් නොව දඹුලු විහාරය බව හැඳින ගැනීමට සෑහෙන තරම් කරුණු ඇත. මේ කරුණු වඩාත් පැහැදිලි කළ හැක්කේ වට්ටගාමිණී අභය සම්බන්ධ කථා පුවතේ දී බැවින් මෙහිදී පැවසිය යුතුව ඇත්තේ දඹුල්ලේ මහරජ විහාරයට උඩින් ඇති බ්‍රාහ්මී ලිපියෙහි එන "තිස මහරජ" අනෙකකු නොව සූරතිස්ස වියයුතු බවය. සියදෙටු සොහොයුරාගේ කීර්ති රාවයත් බ්‍රාහ්මී ලිපිවල එන "තිස" මහරජවරුන් එක්කෝ දේවානම්පියතිස්ස නොඑසේ නම් සද්ධාතිස්ස ලෙස හැඳිනගැනීමට දැරූ උත්සායත් නිසා බුදු සමයේ පණිවුඩය රට තුළට ගෙනගොස් තහවුරු කිරීම සඳහා මේ රජු විසින් කළ සේවාව නූතන ඉතිහාස කෘතිවලින් ගිලිහී ගොස් ඇත. ඔහු විසින් කරවූ විහාර පන්සියයම මහාවංශයෙහි සඳහන් නොවෙතත් එහි සඳහන් වන විහාර නාමවලින් පෙනෙන්නේ ඒවා අනුරාධපුරයෙන් තරමක් ඈත හැම දිසාවකම වාගේ වූ බවය.

දඹුලු ලෙන්වලින් සොයාගත් තවත් බ්‍රාහ්මී ලිපිවල මෙසේ සඳන් වෙයි.

"දමරකිත තෙරහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ දිනෙ ගමණි අබයශ රජියහි කරිතෙ"

(ගමණි අභය රජතුමාගේ කාලයෙහි කරවූ ධම්මරක්ඛිත තෙරන්ගේ ලෙණ දිවුදිගින් ආ නොසංඝයා විෂයෙහි පූජා කරන ලදී.)

ආදී බ්‍රාහ්මී ලිපිවලින් පෙනෙන අයුරු බුද්ධාගම ක්‍රමයෙන් රට තුළ පතළවීමත් මුල් බැස ගැනීමත් සමඟ ගිහි දායක දායිකාවෝ පමණක් නොව ඇතැම් භික්ෂූන් වහන්සේලා ද ලෙන් තනවා මහා සංඝයා විෂයෙහි පිදූහ. මෙම ලිපියද එවැනි පූජාවකට සාධකයකි. මෙම ලිපියෙහි සඳහන් වන භික්ෂූන් වහන්සේ තමන් ලෙෂ තනවා පිදූ කාලයෙහි ජීවත් වූ රජතුමාගේ නම සඳහන් කිරීම වැදගත්ය. ඔහු ගමණි අබය රජුය. තත්කාලීනයකුට හෝ සමීපකාලීනයකුට නම් මේ අනුව ධම්මරක්ඛිත තෙරුන් ජීවත් වූයේ අසුවල් රජතුමාගේ කාලයේදී යයි නිශ්චය කරගැනීම පහසුවූවාට සැක නැත. එහෙත් මුල් කාලයේ සිංහල රජවරුන් කීපදෙනෙකුම "දේවානම්පිය" විරුදය මෙන්ම "ගමණී" විරුයත්"අභය" යන පුද්ගල නාමයත් භාවිතා කිරීම මේ ලිපියෙහි සඳහන් වන රජතුමා නිශ්චය ලෙස හැඳින ගැනීමට බාධකයක්ව පවතී.

12 පිටුවට...

**පොතපත ඇසුරෙන්**

11 පිටුවෙන්....

මුල්රජ පෙළපතට අයත් වට්ටගාමිණී (ක්‍රි.පූ 103 සහ 87 - 77) කුටකණ්ණ (ක්‍රි.ව 44 - 22) භාතික (ක්‍රි.පු. 22 ක්‍රි.ව 7) අමණ්ඩ ගාමණී (ක්‍රි.ව 19 - 29) යන රජවරුන් තමන් "ගමණී" යන විරුදයෙන් හඳුන්වා ගත් අතර, "අභය" යන පුද්ගල නාමය දැරූහ.

එහෙත් වට්ටගාමිණී අභය හැර අන් හැම රජෙක්ම තමන් සෙසු "අභය" වරුන්ගේ වෙසෙසන පුද්ගල නාමය යොදා ශිලා ලිපි කොටවා තිබීම නිසා එවරනි විශේෂත්වයක් ඇති එකම ලිපියකට හෝ හිමිකම් නොකියන වට්ටගාමිණී අභය මේ ලිපියෙහි සඳහන් "ගමණී අභය" ලෙෂ කෙනෙකුට අනුමාන කළ හැකිය. මහාචාර්ය පරණවිතාන පවන අයුරු එවැනි විශේෂ නාමයක් භාවිතා නොකළ ගමණි අභය රජෙකු ගැන සඳහන් වන ලිපි නවයක් ලංකාවේ නොයෙක් තැන්වලින් ලැබී ඇත. මෙම දඹුලු ලිපිය ද එවැන්නකි. මේ ලිපිවලින් පැවසෙන්නේ එක්කෝ මේ රජු, නැතිනම් ඔහුට ඥාතිත්වයක් ඇති කෙනෙක් එසේත් නොවේ නම් ඔහුගේ රාජ්‍ය යුගයෙහි ජීවත් වූ කෙනෙක්, එමළු ක් එක් ලිපියෙහි සඳහන් ලෙන හෝ වෙනත් ආකාරයක පූජාවක් මහා සංඝයා විෂයෙහි පිදූ බවය. අක්ෂර පරිනාමය හා භාෂා විකාශනය අනුව මේ ලිපි වට්ටගාමිණී අභයගේ කාලයට අයත් වියයුතු යයි මහාචාර්ය පරණවිතාන කරන නිගමන හේතු සාධක ඇති එකක් බව මෙයින් පෙනේ. මෙම නිගමනය සාධාරණ ලෙෂ ගනිතොත් වට්ටගාමිණී අභය එහි ලෙන් තනවා නොපිදුවත් ඔහුගේ රාජ්‍ය යුගය දඹුලු විහාරය ගැන අවධානය යොමු වූ කාලයක් බව සිතිය හැකිය.

කෙසේ වුවද මෙම ලිපිය හැර වට්ටගාමිණී අභය දඹුලු විහාරය හා සම්බන්ධ කරන වෙනත් කිසිම ලිපියක් ලැබී නැත. දඹුලු ලෙන් විහාර පමණක් නොව ලංකාවේ බොහෝ ලෙන් විහාර වට්ටගාමිණී අභය මහරජු හා සම්බන්ධ කරන ජනප්‍රවාද ඇත. විශේෂයෙන්ම මේවා අයත් වන්නේ එක්කෝ පැරණි රජරටට නැත්නම් මලය රටටය. මේ සියලු ජනප්‍රවාද වලට මුල්වී ඇත්තේ මේ රජු ද්‍රවිඩ ආක්‍රමණිකයන්ගෙන් පැරද පලා ගොස් ගෙවූ දොළොද් වසක කාලය බෙහෙවින් ම මේ ප්‍රදේශබද වනගත ගල්ලෙන් වැනි ස්ථානවල ගත කිරීම ය. මේ ජනප්‍රවාද මෑත යුගයක නොව දහතුන්වන සියවසේ පවා මේ රටේ ජනතාව අතර ප්‍රබල ලෙෂ ප්‍රචලිතව තිබූ ඒවා බව මෙ සියවසට අයත් කෘතියක් වන පූජාවලියෙහි එන පහත සඳහන් විස්තරයෙන් පෙනේ.

"වළගම් අභා රජ මායා රජයෙහි හිඳ බල පිරිස් ගෙන දිව ගෙන ගොස් නුවර වැද, ඒ දෙමළුන් මරා රජගෙන ලංකාද්වීපයෙහි ගල්ලෙන්වල පෙර තමා වළ වසනා කල ප්‍රයෝජන දැක, කටාර කොවා..."

දඹුල්ල සම්බන්ධව එන ජනප්‍රවාදය මේ හැම එකකට ම වඩා ප්‍රබල වූත් විස්තරාත්මකවූත් එකකි. මේ අනුව දඹුලු පර්වතය සොයා ගන්නා ලද්දේ වනගතව දඩයමේ ගියසීනා නැමැති වැද්දකු විසිනි. මේ පුවත ඔහු අනුරාධපුරයට ගොස් වට්ටගාමිණී අභය මහරජතුමාට දැන්වූ පසු රජු ඔහුට තෑගිබෝග දී මෙම ස්ථානයට පැමිණ මෙහි ලෙන් කැන, පශ්චිම විහාරය, මහරජ විහාරය සහ දෙව්රජ විහාරය යන විහාර මන්දිර තුන කරවීය. මෙම ජනප්‍රවාදයෙහි එන බොහෝ කරුණු විහාරයේ නියම ඉතිහාසය අමතකව ගිය කාල පරිච්ඡේදවල දී එකතු වූ ඒවා බවට සැකයක් නැත. විශේෂයෙන්ම විහාරයට පිදුණු ඉඩකඩම් රාජකාරී ඉඩම් වශයෙන් ලබාගත් යම් යම් පරම්පරාවන් විසින් දඹුලු පර්වතය පිළිබඳ පුවත රජුට දැන්වූයේ තම පරපුරෙ ආදිතමයෙකු විසින් බවත්, ඒ අනුව ඉඩකඩම්වල හිමිකම තමන්ට වළගම්බා මහරජුගෙන් ලැබුණක් බවත්, පෙන්වීමට උත්සුකවීම මෙම ප්‍රබන්ධයට හේතු වූ බව සැලකිය හැකිය. දඹුල්ල පමණක් නොව ඒ අවට ප්‍රදේශත් මුල් ආර්ය ජනාවාස බිහිවූ යුගයට සමීපකාලීනව ජනාවාස බවට පත්ව තිබූ බවට සාධක ඉහතින් දැක්වීමු. ඒ හැරත් දඹුලු පර්වතයෙහි විශාලත්වය හා සැතපුම් කීපයක් ඈත සිට වුව ද වනපෙත අභිබවා එය කෙනෙකුට දැකිය හැකි බවත් ෂලකන විට වට්ටගාමිණී අභය රජුගේ කාලයෙහි එය වනයේ සැඟවුණු පර්වතයක්ව තිබුණු බව කීම කිසිසේත් විශ්වාස කළ නොහැකිය. දුටුගැමුණු රජුගේ කාලයෙහි රජරට අස්සක් මුල්ලක් නෑර විශේෂයෙන් දඹුල්ලට ආසන්නවූ කලාවැව, විජිතපුර වැනි තැන්වල කෙරුණ සටන් ගැන ෂලකන විට දඹුලු පර්වතය පිළිබඳ මේ ප්‍රවාදයෙහි අවිශ්වසනීයත්වය මැනවින් පැහැදිලි වේ. දඹුල්ල වැනි සිද්ධස්ථාන පාලන අනුග්‍රහයෙන් තොරව වනගතව ගිය දඹදෙණි යුගයේ හා ඉන්පසු කාලයේ බිහිව කලින් කල කරුණු එකතු වෙමින් ආ මේ ජනප්‍රවාද මහනුවර යුගයේ දී බොහෝ සෙයින් වර්ධනය වූ බව පෙනේ.

දඹුල්ල සම්බන්ධ ජනප්‍රවාදයෙහි එන වර්ණනාත්මක කොටස හැරත් .කල වට්ටගාමිණී අභය රජු හා මේ විහාරය අතර සම්බන්ධය එහෙම පිටින්ම අහක දැමිය හැකි නොවන බව පෙනේ. මුලදීද පෙන්වා දුන් පරිදි ලංකාවේ අන් කවර ගල්ලෙන් විහාරයක් සම්බන්ධ ජනප්‍රවාදයකටත් වඩා මෙහි රජුත් විහාරයත් අතර ප්‍රබල සම්බන්ධයක් පෙන්නුම් කරයි. මහරජ විහාරය නමින් හැඳින්වෙන විශාලතම ලෙන් විහාරයේ උතුරු දොරටුව විපසින් විහාරය දෙස බලා සිටින ලෙෂ නෙලා ඇති රූපය වළගම්බා රජුගේ යයි දැඩි විශ්වාසයක් පවතී. මෙය රජරුවක් ද බෝසත් රුවක් ද යන්න පැහැදිලි නැත. එය දේවරූපයක් විය නොහැක්කේ විෂ්ණු සහ සමන් දෙවිවරුන්ගේ යයි සැලකෙන ප්‍රතිමා මෙම විහාරයේ ම මීට සමිප වෙනත් තැනක ඇති බැවිනි. රජ රූපය යයි සැලකෙන රූපයටත් දේවරූපවලටත් අතර ඇති ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව දෙපස නාථ සහ මෛත්‍රී බෝධිසත්වවරුන්ගේ යයි සැලකෙන රූප ඇත. මේ විහාරයේම දකුණු කෙළවරේ කීර්ති නිශ්ශංකමල්ලගේ යයි සැලකෙන රූපයත් මීට දකුණු කෙළවරේ කීර්ති නිශ්ශංකමල්ලගේ යයි සැලකෙන රූපයත් මීට යාබද විහාරය වූ මහ අලුත් විහාරයෙහි කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රූපයත් පිහිටි තැන් ෂලකා බලන විට මෙම රූපයත් කකවර හෝ රජ කෙනෙකුගේ යන අදහස බැහැර කළ නොහැකිය. දේවරූප හා බෝධිසත්ව රූපවල ශීර්ෂ පළඳනා දක්වා ඇති ආකාරයත් මෙම රජ රූපවල ශීර්ෂ පළඳනා දක්වා ඇති ආකාරයත් සෑහෙන තරම් වෙනසක් පෙන්නුම් කරයි.

දේවරූප හා බෝධසත්ව රූප ලෙෂ හැඳින ගන්නා රූපවල ශීර්ෂ පළඳනා "කිරීටමකුට" නමින් හැඳින්වෙන ශීර්ෂ පළඳනා ගණයට වැටෙන අතර, ඒ හැම එකකම මධ්‍යයෙහි බුද්ධ රූපයක් දක්නට ලැබේ. වට්ටගාමිණී අභයගේ හා නිශ්ශංකමල්ලගේ ලෙෂ හැඳිනගන්නා රූපවල ශීර්ෂ පළඳනාවල බුද්ධ රූප හෝ එවැනි විශේෂ සංකෙත්යක් තිබූ බවට ලකුණක් නැත. වට්ටගාමිණීගේ යයි හැඳිනගන්නා රූපයේ ශීර්ෂ පළඳනාව පැහැදිලිවම "කරණ්ඩමකුට" ගණයට අයත් වන අතර, රුවන්වැලිසෑය ළඟ ඇති දුටුගැමුණු රූපයේ ශීර්ෂ පළඳනාවට එය බෙහෙවින්ම අනුරූපය. රජ රූප යයි හැඳිනගන්නා මේ රූප දෙකත් තුන්වන විහාරයෙහි ඇති කීර්ති ශ්‍රී රාජසිංහගේ රූපයත් පිහිටා ඇත්තේ විශේෂ තැන්වල වීමද මෙහිදී සැලකිල්ලට ගතයුතු කරුණකි. මහරජ විහාරයේ උතුරු දොරටුවට වම්පසින් ඇති වට්ටගාමිණීගේ යයි සැලකෙන රූපයට විහාරයේ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව මෙන්ම විහාරයෙන් වැඩි කොටසක් ද පැහැදිලිව පෙනේ. මෙම විහාරයෙහි ම දකුණු කෙළවරේ ඇති නිශ්ශංකමල්ලගේ රූපයටද මුළු විහාරයම වාගේ දැක බලා ගත හැකිය. මේ රූප අනුකරණය කරමින් මහනුවර යුගයේදී පිහිටවූ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රූපයට ඔහු විසින් කරවූ මහ අලුත් විහාරය සම්පූර්ණයෙන් වාගේ දිස්වේ.

නාථ හා මෛත්‍රී බෝධිසත්ව රූප ලෙස සැලකෙන රූප දෙක පිහිටුවා ඇත්තේ මහරජ විහාරයේ ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවට දෙපසිනි. බෞද්ධ ප්‍රතිමා ශිල්පීන් හැමවිටම වාගේ අනුගමනය කළ රීතියක් වූයේ බෝධිසත්ව රූප බුද්ධ ප්‍රතිමාවලට සමීපයෙන්ම, බෝධිසත්වරුන් දෙදෙනෙකුගේ නම් එයට දෙපසින් පිහිටුවීමය. දඹුලු විහාරයේදීද ප්‍රතිමා ශිල්පීන් අනුගමනය කර ඇත්තේ රීතියමැයි. දේව ප්‍රතිමා පිහිටුවීමේදී නිතර ම වාගේ අනුගමනය කළ රීතිය නම් ඒවා බුදු පිළිමවලට තරමක් ඈතින් පිටුපසින් හෝ සම්පූර්ණයෙන් ම වෙන් කළ ප්‍රදේශයක පිහිටුවීමය. විෂ්ණු හා සමන් දෙවිවරුන්ගේ යයි ජනප්‍රවාදයෙහි එන මහරජ විහාරයෙහි ඇති ප්‍රතිමා දෙක ද පිහිටුවා ඇත්ාත් මේ රිතියට අනුකූලවය.

මේ කරුණු සලකා බලන විට මහරජ විහාරයෙහි ඇති රජ රූප යයි සැලකෙන රූප දෙක පිළිබඳව ඇති ජනප්‍රවාද අසුවල් රජුගේ යයි හැඳින ගැනීම සම්බන්ධයෙන් සර්ව නිරවද්‍ය යයි නො පිළිගන්නකුට වුවද ඒවා රජ රූප විය යුතුය යන මතය සාවද්‍ය යයි බැහැර කිරීම පහසු නැත.

වට්ටගාමිණී අභය රජු හා දඹුලු විහාරය හා සම්බන්ධය අනුමාන වශයෙන් හෝ ගොඩනැගීමට නම් මහවංශයේත් පූජාවලිය හා නිකාය සංග්‍රහය ඇතුළු සිංහල මූලාශ්‍රවලත් මේ රජු පිළිබඳව එන ප්‍රවෘත්ති ගැන අවධානය යොමු කළ යුතුව ඇත. මහාවංශය හා දීපවංශය අනුව මේ රජු ද්‍රවිඩ සතුරන් අතින් පරාජයට පත්වූයේ අනුරාධපුරයටත් මහාතිත්ථයටත් අතර වූ කොළම්බහාලක නම් ස්ථානයේදීය. දුටුගැමුණු රජු අතින් හල්ලුක පරාජයට පත්වූයේත් මෙතැනදීමය. සූරතිස්ස රජු අනුරාධපුරයට උතුරින් කොළම්බහාලන නම් විහාරය තැනවූ බව මහාවංශයෙහි සඳහන් වේ. මේ අනුව මෙය අනුරාධපුරටත් මහාතිත්ථයටත් අතර වූ වැදගත් සන්ධිස්ථානයක් බවට සැකයක් නැත. සතුරන් අතින් පැරද පලා යන රජු වර්තමාන අභයගිරිය පිහිටි ප්‍රදේශය ඔස්සේ ගමන් ගනිද්දීය. ඔහුට ගිරි නම් නිගණ්ඨයාගේ "මහකළු සිංහලයා පලා යති" යන කියමනට මුහුණ දෙන්නට සිදුවූයේ මෙතැනින් පැනගත් රජු තාවකාලිකව සැඟවී ගත්තේ වෙස්සගිරි විහාර උපවනයෙ බව වංසත්ථප්පකාසිනිය පැහැදිලිව සඳහන් කරයි. වෙස්සගිරි විහාරයත් එම උපවනයත් පිහිටියේ අනුරාධපුර නගරයෙන් නැගෙනහිර පෙදෙසක බව පෙනෙන්නේ රජු ආරක්‍ෂාව පතා පලා යමින් සිටියේ මලය දේශය කරා බැවිනි. එය අනුරාධපුරය අසල පෙදෙසක් විය නොහැකිය යන මතය පිළිගත නොහැක්කේ රජු ඇතුළු කීප දෙනෙකුට ටික දවසක් සැඟවී සිටීමට එවැනි තැනක් යොදා ගැනීමේ වැදගත්කම සලකන විට ය. එය වෙස්සගිරි වනය නොව වංසත්ථප්පකාසිනියෙහි එන අයුරු වෙස්සගිරි විහාර උපවනය අමතක නොකළ යුතුය. ආරණ්‍යක ජීවිතයක් ප්‍රිය කළ භික්‍ෂුණ් වහන්සේලා උදෙසා වූ මෙබඳු උපවනයක් අනුරාධපුරය අසල නොතිබිණැයි සැලකීම යෝග්‍ය නොවේ. හැරත් එවැනි තැනකට විදේශික ආක්‍රමණිකයෙකුට තබා ස්වදේශික රජෙකුගේ නිළධාරීන්ටත් අනවසරයෙන් ඇතුල්වීම තහනම් කරමින් පනවා තුබූ නීතිරීති ගැන සලකන විට රටේ පාලන බලය අල්ලා ගෙන සිටීමේ පරමාර්ථයෙන් පැමිණි පිරිසක් එක්වර ම එම නියෝගය කඩකරතැයි සිතීම යෝග්‍ය නොවේ. වෙස්සගිරි උපවනයේ දී කුපික්කල මහා තිස්ස තෙරුවන්ගෙන් සංග්‍රහ ලැබූ පිරිස වැඩි දවස් නොයවාම එතැනින් මලය රට බලා ගමන් ගත්හ.

මෙතැන් සිට අවුරුදු දහහතරකුත් මාස හතක් වූ වට්ටගාමිණී අභය රජුගේ අවාසනාවන්ත කාලය ගෙවුණේ මලය දේශයේදී කුපික්කල මහා තිස්ස තෙරුන් විසින් තුමන්ට හඳුන්වා දුන් තනසිව නම් ප්‍රාදේශාධිපතියා ළඟය. රජු අනුරාධපුරයෙන් පලා ගිය මාර්ගයත් ඉන්පසු කාලය ඔහු ගත කළ ස්ථානත් හැඳින ගැනීමේදී නූතන ඉතිහාස කෘතිවල බරපතල අවුල් තත්වයක් දක්නට ඇත. වෙස්සගිරි විහාර උපවනයෙන් ඔහු ඇතුළු පවුලේ අය ගිය මඟ ලෙස වංසත්ථප්පකාසිනිය දක්වන්නේ පබ්බතවිහාර සමීපයෙහි වූ සිලාසොබ්භකණ්ඩක නම් ගම. එතැනින් මලය දේශයේ වූ සාමගල්ල සමීපයෙහි මාතුවේලංගය ආදී වශයෙනි. ටීකාව ලියූ කාලය වන විට මාතුවේලංගය හැඳින්වූයේ මෝරගල්ල නමිනි. රජු අනුරාධූපරයෙන් පලා ගිය මාර්ගයත් ඔහු අවුරුදු දහහතරකුත් මාස හතක් අප්‍රසිද්ධ වේශයෙන් ගතකළ ස්ථානත් මලය දේශයේ වූ බව හැඳින ගැනීමෙහි ලා මහංවංශ ටීකාව ලියූ භික්‍ෂුන් වහන්සේට කිසිම ගැටළුවක් නොවූ බව එතුමන්ගේ කාලයෙහි මාතුවේලංගය (හෝ සාමගල්ලය) හැඳින්වූයේ මෝරගල්ල නාමයෙන් බව දැක්වීමෙන් පෙනේ.

කතා පුවත අවුල්කර ඇත්තේ නූතන ඉතිහාසකරුවන් විසිනි. රජු

15 පිටුවෙන්...



# සමාජ සබඳතා පිළිබඳ වූ බෞද්ධ ප්‍රඥප්තිය

**පු**ද්ගලයාත් සමාජයත් අතර ඇත්තා වූ සබඳතාවය ගසට පොත්තත්, පොත්තට ගසත් මෙන් වූවක් බව නූතන සමාජ වියතුන්ගේ මතයයි. එකී මතය ගෞතම බුදුපියාණන් වහන්සේ විසින් තහවුරු කොට ඇත්තේ මීට වසර දෙදහස් පන්සියයකටත් වඩා ඉහතදීවීම බව බොදු අප පවසනුයේ මහත් ආඩම්බරයෙනි.

මන්ද යත් නූතන වියතුන් ප්‍රකාශ කරගන්නා වූ බොහෝ කරුණු කාරණා බුදු පියාණන් වහන්සේ විසින් තහවුරු කොට ඇත්තේ ඈත අතීතයේ සිටය. උන් වහන්සේ දෙසූ, අසූ හාර දහසක් ධර්මස්කන්ධය අතුරින් බිඳක් නොහොත් මහ සයුරින් දිය බිඳක් වැන්නා වූ එක් කරුණක් පිළිබඳ යමක් වහරන්නට කාලෝචිතය. පුද්ගලයා මැනවින් ජීවත් වීමට නම් සමාජය පිළිබඳ දැනුම මෙන්ම සමාජ සබඳතාවය ඉතා වැදගත්ය. එකී කරුණු කාරණා දෙසූ සිඟාලෝවාද සූත්‍රය පිළිබඳ අංශු මාත්‍රයක් තරම් කරුණක් හැදෑරීම දිවියට යහපතකි.

සිය පියා තම පුත්‍රයා හික්මවීමට යෙදූ උපායක් ලෙස සිඟාල ගෘහපතියා උතුර දකුණ ආදී වශයෙන් වූ සදිසාවන් නමස්කාර කළේය. අර්ථයෙන් තොර වූ එකී ක්‍රියාව දුටු බුදුරජාණන් වහන්සේ '' ආර්ය විනයේ සදිසා ඕවා නොවේය '' යන්න වදාරා ආර්ය විනයේ සදිසා ඔහුට පහදා දුන්සේක. එතැනින් ඇරඹූ සිඟාලෝවාද සූත්‍රය සමාජ දිවියට වටිනාවූ කරුණු රැසකින් සමන්විතව දීර්ඝව දේශනා කළ සේක. මෙකී සූත්‍ර දේශනාවේ කරුණක් ගත හොත් ඒ තුළින් ගත හැකි දේ එමටය. කොළයක් දෙකක් නොව පොත් ගණනාවක් වුවද කරන්නට එහි කරුණකින් හැකිය. එසේ හෙයින් මෙහිදී සූත්‍ර ගත කරුණු පිළිබඳ ඉතා කෙටියෙන් පමණක් යමක් සඳහන් කිරීමට උත්සුක වන බව සැම දත යුත්තේමය.

ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමයන් හි වරදවා හැසිරීම, අසත්‍ය ප්‍රකාශ කිරීම නොහොත් මුසාවාදය යනාදී වශයෙන් වූ සතර කර්ම ක්ලේෂයන් ප්‍රහීන කරන්නා හට මෙලොවත්, පරලොවත් සුවදායක වන බවත් මරණින් මතු සුගතියෙහි උපදින බවත්, ඡන්දය, ද්වේෂය, භය, මෝහය යනාදී වූ සතර අගතියෙහි අගතිගාමී වන්නා එකී කරුණින් පවක් කරනු නියතය. තවද, එකී කරනු වලින් අගතිගාමී නොවන්නා එම සතර කරුණින් පවක් නොකරන බවද, සූත්‍ර ගතව ඇත. සතර අගතියෙන් ධර්මය ඉක්මවන්නාගේ අවපස සඳු මෙන් යහපත පිරිහෙන අතර, සතර අගතියෙන් ධර්මය නොඉක්මවන විට පුරපස සඳු මෙන් ඔහුගේ යසස දියුණු වන බවද දත යුතුය. ආර්ය ශ්‍රාවකයා සවැදෑරුම් වස්තු විනාශ මුඛ නොහොත් අපාය මුඛ සයහි නිරත නොවිය යුත්තේය. රහමෙර පානය, අවේලාවේ වීදි සංචාරය, සැණකෙලි - මේලා ආදියට යාම, සූදුව, පව්ටු මිතුරු ඇසුර, අලස බව යනාදිය වස්තු විනාශයට සොරොව්වකි. එකී කරුණු සයෙහි ආදීනවයන් වෙන් වෙන් වශයෙන් සවිස්තරාත්මකව සූත්‍ර ගත දෙසුම තුළ අන්තර්ගතය.

අනතුරුව දේශනා කොට ඇත්තා වූ කාරණය ද, සමාජ දිවියට ඉතා වැදගත් ය. මිතුරු ඇසුර අප කාගේත් දක්නට ඇත්තා වූ ලක්ෂණයකි. එසේ නමුදු නිසි මිතුරන් හා මිතුරු වෙසින් සිටින්නා වූ, මිත්‍ර ප්‍රතිරූපකයන් සිව් දෙනෙකු පිළිබඳවද කරුණු දක්වා ඇත. හිස් අතින් අවුත් දුන් දේ ගෙන යන්නා වූ (අඤ්ඤදත්ථුහරයා) තැනැත්තා, වචනයෙන්ම ගුණන් පියවන්නා (වචීපරමයා) වූ තැනැත්තා, ඇති තැන ගුණ හා නැති තැන අගුණ කියන්නා වූ, (අනුප්පියභාණියා) තැනැත්තා, වැරදි වැඩටම එක් වන්නා වූ (අපාය සහයකයා) තැනැත්තා යනාදී වශයෙන් මිත්‍ර ප්‍රතිරූපකයන් සිව් දෙනා දක්වා අනතුරුව ඔවුනගේ ලක්ෂණද පෙන්වා දී ඇත. එමෙන්ම සුහද මිතුරන් සිව් දෙනෙකු පිළිබඳවද වේ. එනම් උපකාරක මිත්‍රයා, සුව දුක් දෙකෙහිම සමානව පවතින සමාන සුඛ දුක්ඛ මිත්‍රයා, වැඩකට ඇති දෙයම පවසන අත්ථක්ඛායි මිත්‍රයා හා අනුකම්පා කරන්නා වූ අනුකම්පක මිත්‍රයා වශයෙනි. මොවුන්ගේ ද ලක්ෂණයන් වෙන් වෙන් වශයෙන් සූත්‍ර ගත දෙසුමෙහි දක්නට ඇත.

පුද්ගල ජීවිතය සාර්ථක කරනු ගනු වස් ආර්ථික කළමණාකරණය සුවිශේෂ වන්නකි. එහි වැදගත් වූ කරුණ පිළිබඳවද මෙකී සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන්ව ඇත. මල් පැණි රැස් කොට මී බඳින බඹරුන් සේ ධනය රැස් කරන්නන්ගේ බෝග සම්පත් වැවෙන බව දත යුතුය. මේ අයුරින් ධනය රැස් කරන්නා ධනය කොටස් හතරකට බෙදනු ඇත. එනම් කොටසක් එදිනෙදා කටයුතු වලටත්, දෙකොටසක් ව්‍යාපාර වලටත්, සිව් වන කොටස මතු ආපදා වලදී ගැනීමටත් වෙන් කරනු ඇත. නූතන සමාජයේ බොහෝ දෙනෙකු කොපමණ මුදල් රැස් කළද එකී මුදල් පරිහරණය පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැති අතර නිකරුණේ මුදල් වියපැහැදම් වී නැති නාස්ති වනු දැකිය හැකි අවස්ථා සුලභය. එවැන්නන් හට මෙකී කරුණු කාරණා ඉතා ඵල සහිතය.

ගිහි විනය ලෙස නම් කළ හැකි සිඟාලෝවාද සූත්‍රයෙහි දක්නට ඇති තවත් වැදගත් කරුණක් ලෙස සදිසා වන්දනය ප්‍රකට වූවකි. මව්පියෝ නැගෙනහිර දිශාවෙන්ද, ගුරුවරු දකුණු දිශාවෙන්ද, ස්වාමි- භාර්යා බස්නාහිර දිශාවෙන්ද, දාස කම්කරුවෝ යට දිශාවෙන්ද, මිතුරන් උතුරු දිශාවෙන් හා මහණ බමුණන් උඩ දිශාවෙන් පෙන්වා දී ඇත. මේ අයුරින් ඉතා අර්ථ සම්පන්න ලෙස දිශා වෙන් කොට දී ඇති අයුරු ප්‍රශංසනීය වේ. මෙහි කිසිදු දිශාවක් පහත් කොට සළකා නොමැති අතර සෑම දිශාවකටම ගරුත්වයක් මෙන්ම වටිනාකමක් ලැබී ඇති අයුරු දක්නට ඇත. සමාජය මැනවින් පැවතීම පිණිස මෙකී සෑම දිශාවකම අන්‍යෝන්‍යය පැවැත්ම වැදගත් වන බව මනාව ප්‍රත්‍යක්ෂ වන්නකි. මෙහි සුවිශේෂ වූ වැදගත්ම කරුණ වන්නේ මෙහි සදිසාවන් හා සබැඳි අන්‍යෝන්‍යය යුතුකම් මාලාවයි. මෙය සමාජය යහපත් සමාජයක් කිරීමට මෙන්ම සමගි සම්පන්න, වැඩදායක සමාජයක් බිහිවීමට ද මැනවින් ඉවහල් වන්නකි.

මවුපියන්ගෙන් දරුවන්ටත්, දරුවන්ගෙන් මව්පියන්ටත් ඉටුවිය යුතු යුතුකම්, ගුරුවරුන්ගෙන් සිසුන්ටත්, සිසුන්ගෙන් ගුරුවරුන්ටත් ඉටුවිය යුතු යුතුකම්, ස්වාමියාගෙන් භාර්යාවටත්, භාර්යාවගෙන් ස්වාමියාටත් ඉටුවිය යුතු යුතුකම්, මිතුරන්ගෙන් මිතුරන්ට ඉටුවිය යුතු යුතුකම්, සේව්‍යයාගෙන් සේවකයාටත් සේවකයාගෙන් සේව්‍යයාටත් ඉටුවිය යුතු යුතුකම්, ගිහියාගෙන් පැවිද්දාටත් පැවිද්දාගෙන් ගිහියාටත් ඉටුවිය යුතු යුතුකම් යනාදී වශයෙන් වූ අන්‍යෝන්‍ය යුතුකම් මාලාව ලොවට හඳුන්වා දුන් අසහාය නායකයාණෝ ගෞතම බුදුරජාණන් වහන්සේය.

එකී අන්‍යෝන්‍ය යුතුකම් වෙන් වෙන්ව සුපැහැදිලිව සිඟාලෝවාද සූත්‍රයෙහි දක්නට ලැබීම යහපත් සමාජ දිවියක් ගත කරලීමට වෙර දරන්නවුන්ගේ සුභසිද්ධියට හේතුවනු නියතය. මෙසේ වූ දිසා නමදින්නා වූ ගිහියා ගිහිගෙයි විසීමට සුදුසු මෙන්ම එකී ගිහිගෙයි වීසීමට සමත් වනු නිසැකය.

තවද නුවණැති වූ සීල සම්පන්න වූ සියුම් අරුත් දැන කථා කරන්නා වූ ප්‍රතිභා සම්පන්න වූ, අවනත පැවතුම් ඇත්තා වූ, තද ගති නැත්තා වූ යම් පණ්ඩිතයෙක් වේද, ඔහු කීර්තිමත් වනු ඇත. එසේම වීර්යයෙන් යුත් අනලස්, අකම්පිත ඥාණවන්තයා ද කීර්තිමත් වනු ඇත. තවද සතර සංග්‍රහ වස්තුවෙන් ලෝකයාට සංග්‍රහ කරන්නා වූ මිතුරන් ඇති කර ගන්නා වූත්, කී දේ හා ඇසූ දේ දැන ගන්නා වූත්, මසුරු බවින් ඈත් වූත් නායකත්වයෙන් නිසි ලෙස සෙස්සන් හික්මවන්නා වූත් නිසි මඟ යන්නා වූත් යමෙක් ඇද්ද ඔහුද කීර්තිමත් වනු නියතය.

15 පිටුවට...

ආර්. එන්. එච්. සමන් ජයරත්න


5
භද්‍රා කුණ්ඩලකේශී

සුරස අතිරේකය

සුභාවිත ගීයක

# ජීවිත ස්වභාවය අර්ථවත් වන අයුරු

ගලන්න ගලන්න ගලන්න
ගංගාවක් වී ගලන්න
උල්පත පසු කර
නැවක් වෙලා නතර වෙන්න
නෙළුම් මලක් යට

නිල් දිය මත ගල් කැටයක්
වැටුණු වෙලාවට
රැල් සිය දහසක් නැගේවි
රිදිලා හදවත

දුවිල්ලෙන් වැහුණු දාට
මුළු මිටියාවත
සිහි කරන්න කඳු පාමුල
මව් කිරි උල්පත

බිම් මල් යට පිපුණු පැතුම්
පෑගී යන විට
කඳු මුදුණට නැග බලන්න
ජීවිතයේ උස

ගේය පද - රත්න ශ්‍රී විජේසිංහ
තනුව හා සංගීතය - ආචාර්ය ප්‍රේමසිරි කේමදාස
ගායනය - ඉන්දිකා සමරසේකර



උල්පතකින් මතු වන කුඩා දිය දහර එක තැනක නතර නොවේ. එය ගඟක් වී ගල් පර වල වැදෙමින් , විටෙක කඳු මුදුන් වලින් ඇල්ලක් සේ කඩා වැටෙමින් ඉදිරියට ගලා යයි. එක් උල්පතකින් උපදින ගංගාවට අතරමැද දී තවත් එවැනිම අතු ගංගාවන් එක් වී නිම්න තැනිතලා පසුකොට අවසන මහ මුහුදට ගලා යයි. ගංගාවේ හැසිරීම අපගේ ජීවිතයට උපමා කළ හැකිය. ඉතා කුඩා උල්පතකින් මතුවන ජීවිතය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදෙයි. ගල් පර නැමැති අසීමිත බාධක හමුවේ ද නොනැවතී ජීවිතය ගලයි. වියළි කාලයේ ක්‍ෂය යන දියදහර දුක් කම්කටොළු වලට මුහුණ දෙන මිනිසෙකු වැන්න. වස්සානයේ දී යළිත් ගං දිය මල්වර වෙයි, කෙළිලොල්ව කිරි සිනා නංවමින් ගලා යයි. අතර මැද මුණගැහෙන අතු ගංගා යනු ජීවිතයට එක් කර ගන්නා ජීවිත පරිඥාන ය මෙන්ම ධනය හා බලය ද විය හැකියි. ජීවිත පරිඥානය තුළින් තමන් වටා වූ නිම්න භූමිය ද සරුසාර කරයි. අවසානයේ අවසානයේ මුහුද නැමැති මරණය වෙත ළඟා වෙයි. ගඟක උරුමය නීරස කරදියට මුසුවීමය. මිනිස් දිවියක උරුමය මරණය කරා ගමන් කිරීම ය.

ගඟක උරුමය නීරස කරදියට මුසුවීම වුව එම නිරස අවසානය ගැන ළතවෙමින් ගඟ සිය කාර්යන් අමතක නොකරයි. සියලුම බාධක මැඩ ගෙන සිනා නගමින් ඉදිරියට යන ගඟ අවට නිම්න භූමි සරු කරමින් නිල්ල වපුරයි. පිපාසිත මිනිසුන්ට හා සතුන්ට සිසිල් පැන් පොදක් සපයයි. එලෙස ගලා ය අතර සිය අත්දැකීම් වලින් ජීවිතය පෝෂණය කර ගනී. එ නිසාම ගංගාවේ ජීවන ගීතය ද අපට ආදර්ශයකි.

අප ගංගාවක් සේම උල්පත පසුකොට ගලා යායුතු ය. උල්පතක් වී එක තැන නතර වුවහොත් ජීවිතයේ සොඳුරු බව වින්දනය කළ නොහැකි වේ. අප අභියෝග භාරගෙන නොබියව ඉදිරියට යායුතු ය. ගඟකට වැවක් බවට පත් වී ස්වල්ප කාලයක් නතර වී අවට කෙත් බිම් සරු කරන්නට ද පුළුවන.

එය වියළි බිම සිසිල් කරවමින් රැඳී සිටියි. ගඟට නොනැවතී ගලන්නට මෙන්ම මොහොතක් නෙළුම් මල් යායක නතර වී සිනා සෙන්නට ද පුළුවන. එලෙසින් ජීවිතයේ සොඳුරු තැන් වල මොහොතක් නැවතී එහි ආශ්වාදය විඳින්නට ද අපට හැකි විය යුතුය.

වැවක් වී නතර වුණ දිය දහරට ගල් කැටයක් වැටුණු විට රැල් සිය දහසක් නැගුව ද ස්වල්ප වෙලාවකින් ඒ රැල් සිය දහස නොපෙනී ගොස් වැව නිසල වෙයි. රිදුමක් ඇති වූ විගස මහත් වේදනාවක් ගෙන දුන්න ද කල් ගත වන විට ඒ රිදුම් සාමාන්‍යකරණය වී සමනය වී යයි. එලෙසින් අප වෙත පැමිණෙන රිදුම් හමුවේ කාලයට ඉඩ හැර අප නිහඬව සිටිය යුතු නොවේ ද?

කාලය ගතවීමත් සමග නිල් දිය උනන උල්පත් සිඳී යා හැකිය. එහෙත් ගඟක් වී ගලන්නට ජීවය දුන් මව් කිරි උල්පත අපට සදානුස්මරණීයයි. මේ මව් කිරි උල්පත අප ශිල්ප ලැබූ පාසල , ගුරුවරුන් හෝ අපගේ දෙමව්පියන් විය හැක. අකුරට ඇවිදින් ශිල්ප ඥානය ලබා ගෙන පාසල නම් උල්පත පසු කොට ගඟක් මෙන් ගලා යන්නට දරුවනට පුළුවන.

ශිල්ප ඥානයත් ජීවිත පරිඥානයත් ලබා ගන්නා විට අප ගෙවන ජීවිතය කෙතරම් විශාල ද, මෙලොව කෙතරම් අප නොදුටු දෑ තිබේ ද යන්න වැටහෙයි. රත්න ශ්‍රී මේ ගීතයෙන් අමතන්නේ දරුවන්ය. ශිල්ප ඥානයත් ජීවිත පරිඥානයත් ලබා ගෙන ජීවිතයේ යථාර්ථයත් එහි පුළුල් බවත් දැකගන්නා ලෙෂ දරුවන්ට පවසයි. කෙටි කාලීන පැතුම් බිඳ වැටුණ ද ජීවිතය අත් නොහැර එහි උපරිම ස්ථානයට ගමන් කළ යුතු බවත් ගීතයෙන් කියවෙයි.

ආරියරත්න ඇතුගලයන්ගේ " රම්‍ය නගරය" ටෙලිනාට්‍ය උදෙසා රචනා වූ ගීතය ගයන්නේ ඉන්දිකා සමරසේකර විසිනි. ඇගේ හඬ ගඟක ගලා යන රිද්මයට මුසුව ගලා යයි. ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන්ගේ තනුව හා සංගීතය ගීතයේ අරුතට අපූර්ව සෞන්දර්යක් මුසු කරවයි.



රත්න ශ්‍රී විජේසිංහ මහතා




ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහතා



ඉන්දිකා සමරසේකර මහත්මිය


චාමිකා ජනානිද සිල්වා

# ධර්ම දේශනාවේ අගය



මහින්දාගමනයෙන් පසු ධර්මද්වීපයක් බවට පත් අපේ රට නිවුණු සැනසුණ මානව ශිෂ්ඨාචාරයකට හිමිකම් කියූ බව ඉතිහාසය කියා දෙයි. අවංක හදවතින්ම සැදැහැ සිත් උපදවා සම්මා දිට්ඨියෙන් " විමසා බැලුව හොත් අතීතයේ ඇසෙන ඒ අභිමානවත් පණිවුඩය බණ පදයක් මිස අන් දෙයක් නොවේ. නිසල සිතකින් සසල කළ ගල් කටුවකින් අසල තිබූ ගල් තලිපකින් නිසසල සමාධි ගුණ වැගිරෙන බුදු රුවක් මවන්නට ගල් වඩුවා සමත් වූයේ හෙළ බණ පද වලින් ලද කුසල බලයෙන් මිස ලාබයට ලෝබයෙන් දූෂිත සිතින් නොවී.

එදා මෙදා තුර අපට ඇහෙන බණ පද සහ අප විසින් අසනු ලබන බණ පද අප ජන සමාජයට කර ඇති බලපෑම් කෙබඳු දැයි සිතිය යුතු කාලය එළැඹ තිබේ. මතක බණ, හත්දොහේ බණ, කඨින බණ, පොහෝදා බණ, කවි බණ, යක් බණ, යුගාසන බණ, ආදී මෙකී නොකී ධර්මදේශනා ක්‍රම අපගේ ජනසමාජයේ සංස්කෘතික උරුමයක් ලෙස ස්ථාපිත වී තිබේ.

" බුදුබණ ඇසුවත්
නිරන්තරේ
බුදුබණ කීවත්
නිරන්තරේ
ගතිගුණ අතින් අපි
තවමත්
වනන්තරේ.......වන
න්තරේ..."

යනුවෙන් රඹුක්කන සිද්ධාර්ථ හාමුදුරුවෝ ගී පදයක සඳහන් කළත් මගේ නම් හැඟීම ඊට වඩා වෙනත් පැත්තක්, මේ වාණිජ සමාජ ක්‍රමය තුළ සල්ලි වලින් සැප සොයන, ආත්මාර්ථය පරම චින්තනය කොටගත් අවස්ථාවාදී මිනිසුන්ගේ මායාකාරී මවා පෙන්වීම් වලින් මත් වූ අහිංසක මිනිසුන් මේ තරම් වත් ආරක්ෂා වී ඇත්තේ මේ තරම් බණ කියන නිසා යැයි මට සිතේ. බණ පිරිත් පිංකම් පවා ප්‍රිය සාදයක් බවට පත් කර ගැනිමට තරම් පරිහානී දර්ශනයක් අනුගමනය කරන ඇතැම් නූතන ධනවතුන් පින්කමක අසිරිය වනසන්නට තැත් කළත් අපේ සංඝ පීතෘවරයාණන් වහන්සේලා සිය දහම් පදවල යථාර්ථවාදී සත්‍ය රසය දිව ඔසුවක් කොටගෙන නන් මිත්‍යාවන් පරාජය කරමින් සිටිති.

මානව චින්තනයට යහ මඟක් නිර්මාණය කර දුන් නිර්වාණ මාර්ගය දේශනා කළ බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා ක්‍රම කීපයක්ම භාවිතා කොට ඇත. ඒවානම් මෙසේය,

1. **බුද්ධො සෝ භගවා බෝධාය ධම්මං දේසේති.**
**(බුදුන් වහන්සේ ප්‍රථමයෙන් ධර්මය අවබෝධකර ගෙන දෙවනුව ලෝකසත්වයාට අවබෝධ කිරීමට ධර්මය දේශනා කරති.**

2. **දන්තෝ සෝ භගවා දමථාය ධම්මං දේසේති.**
**(ප්‍රථමයෙන් දමනය වූ බුදුන් වහන්සේ දෙවනුව ලෝකසත්වයාට දමනය පිණිස ධර්මය දේශනා කරති)**

3. **සන්තෝ සෝ භගවා සමථාය ධම්මං දේසේති.**
**(ප්‍රථමයෙන් ශාන්ත බවට පත වූ බුදුන් වහන්සේ දෙවනුව**

දේශනා කරන සෑම බණ පදයකම එය තමන් දැන දැක පසක් කරගත් බවට සහතිකයක් තිබිය යුතු බවයි. අනුන් සුවපත් කරන්නට දේශනා කරන බණ පදය තමන් සුවපත් කළ ඔසුවක් ලෙස පෙන්වා දිය හැකිනම් ඒ දේශකයාණෝ පරමාදර්ශී තැනැත්තෙකි. එසේම ධර්ම දේශකයාණන් වහන්සේ නමක් තුළ පැවතිය යුතු තවත් ප්‍රතිපත්තිමය ගුණාංග පහක් සම්බුද්ධ දේශනාවේ සඳහන්ය. එනම්,



1. **ආනුපබ්බී කථං කථෙස්සාමිති ධම්මෝ දේසිතබ්බෝ**
**(අවුලෙන් තොරව පිළිවෙලක් ඇති කථාවක් කරමියි, ධර්මය දේශනා කළ යුතුයි)**

2. **පරියාය කථං කථෙස්සාමී,තී ධම්මෝ දේසිතබ්බෝ**
**(ඒ ඒ කරුණු එසේ වීමට හේතුදක්වමින් සුදුසු කතාවක් කරමී යනුවෙන් ධර්මය දේශනා කළ යුතුයි)**

3. **අනුද්දයතං පටිච්ච කථං කථෙස්සාමී,ති ධම්මෝ දේසිතබ්බෝ**
**(දුකටපත් සත්වයන් දුකින් මුදවීම යැයි කුළුණෙන් තෙත් වූ හදවතින් ධර්මය දේශනා කළ යුතුය.)**

4. **ආමිසන්තරෝ කථං කථෙස්සාමී,ති ධම්මෝ දේසිතබ්බෝ**
**(සිව්පස හෝ කීර්ති ප්‍රශංසා ආදී ආමිෂයක් ලබමි යන බලාපොරොත්තුව නැතිව ධර්මය දේශනා කළ යුතුය)**

5. **අත්තාං පරං අනුපහච්ච කථං කථෙස්සාමී,ති ධම්මෝ දේසිතබ්බෝ**
**(තමන් හුවා දැක්වීමට හෝ අනුන් පහත් කොට සැළකීමට නොව අනුන්ගුණ නොනසන කතාවක් කරමී යන අරමුණෙන් ධර්මය දේශනා කළ යුතුය.)**

මෙම කරුණු නොසලකා හැර ධර්මය දේශනා කරන දේශකයාණන් වහන්සේ නියම දේශකයෙකු නොවන බව සැළකිය යුතුයි.

ධර්ම දේශනාවක කාලය අපේ රටේ නම් පැයක් හෝ විනාඩි 45 ක් සීමා වී ඇත්තේ ගුවන් විදුලි ධර්මදේශනා ආරම්භ වූ පසුවයි. එසේ නොමැති නම් එහි කාල නිර්ණය තීරණය විය යුත්තේ දේශකයාණෝ පැහැදිළි කර දීමට සූදානම් වූ දහම් කරුණු පැහැදිළිකර අවසන් වූ කාලයයි. එසේත් නැතිනම් ශ්‍රාවකයා එය තේරුම් ගෙන අවසන් වූ කාලයයි. උපත්ස්ස පරිබ්‍රාජකයාණන් අස්සජි හිමියන්ගෙන් ශ්‍රවණය කළේ ගාථා පද හතරක් පමණි. එයින් මුල් පද දෙකක ශ්‍රවණය කරත්ම හෙතෙම සෝවාන් වූ බවක් සඳහන් වෙයි. මේ අනුව අප නිගමනය කළ යුත්තේ ධර්ම දේශනාවක වටිනාකම රැඳී ඇත්තේ ඉදිරිපත් වන කරුණු හා තේරුම් ගන්නා කරුණු අතර ඇති සම්බන්ධතාවය මත බවයි.

අද පැවැත්වෙන ප්‍රදර්ශනාත්මක ධර්ම දේශනා ක්‍රම මඟින් ප්‍රයෝජන ලබාගන්නේ ඉතා අල්ප කොටසකි. ශ්‍රාවකයන් මනස අඳුරෙන් ආලෝකයට පුබුදුවා ගත හැකි විනාඩි ගණනක් එම දේශනා කාලය තුළ අපට වෙන් කර ගත හැකි නම්, බුදු බණ පදයක අසිරියෙන් අපගේ ජීවිත සිරිමත් කරගත හැකිය. ගැඹුරු දහම් පද වියතුන් සභා මැද පමණක් දේශනා කොට සාමාන්‍ය ජනතාව අතර සැමට වැටහෙන සරළ බස් වහරකින් සිය දේශනාවන් පැවැත්වීම දේශකයාණන් වහන්සේලාගේ වගකීමක් වන අතර දේශක ගෞරවය රැකගෙන සම්ප්‍රධායන් තුළ පවතින හරයන්කද බිඳ නොහැර නැනුවන් වඩවා ගැනීමේ අරමුණ පෙරදැරිව ධර්ම ශ්‍රවණය කිරීම ශ්‍රාවකයන්ගේද යුතුකමකි.

සාමවිනිසුරු ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේ ගෙදර.



# ජීවිතයක වටිනාකම

සමාජය යනු පුද්ගලයන් සමූහයක අන්‍යෝන්‍ය ලෙස බැඳී පවත්නා සන්ධිස්ථානයකි. වර්තමාන සමාජය වූ කලී ඉතා සංකීර්ණ එකකි. එයට ප්‍රධාන ලෙස තාක්ෂණික දියුණුව බලපා ඇත. මිනිසාගේ ජීවිතය සංකීර්ණ වූ ප්‍රශ්න රාශියකින් වෙලී පවති. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය වනාහී පරලොව ප්‍රීතිය නොව මෙලොව ධර්මානුකූලව තම ජීවිතය සකසාගෙන තමන්ගේ නවගාමී ජීවිතය සඳහා මහෝපකාරී වන සොබාදහමට පවා අනුගතව පවත්නා පොදු ධර්මතාවයකි. ලොව පැතිරී ඇති අනෙක් ආගම් හා දර්ශනයන් යම් තර්කයක් හෝ නිගමනයක් මත පිහිටි ධර්මයන් අතරේ ඒ සියළු ආගම් හා දර්ශනයන් පසෙකලා ලෝකයේ සැබෑ තතු එලෙසින්ම දැක එහි නොඇලී නොගැටී එයට හේතු ප්‍රත්‍ය සොයාගෙන මේ භයංකර වූ දුක් සහිත වූ සසර කතරින් එතෙරවීම සඳහා අවබෝධ කරගත යුතු ධර්මතාවයකි.

අනවබෝධය හේතු කොටගෙන අපමණ වූ දුක් කම්කටොළු වලට ලෝක සත්වයා මුහුණු දෙයි. සසර ගමන තව තවත් දීර්ඝ වන්නේ යහපත අයහපත මුහුණ පිළිබඳ අනවබෝධයෙන් යුතුව ජීවත්වීම නිසාවෙනි. අනේක වූ සත්වයින්ගේ යුක්ත වූ ලෝකයෙහි මිනිසා නැමැති සත්වයාට විශේෂත්වයක් හිමිවේ. මනසින් උසස් වූ නිසා මිනිසා යනුවෙන් සළකයි. එනම් දියුණු ඥාණ ශක්තියක් හෙවත් සිහි කල්පනාවෙන් යුක්තව කටයුතු කිරීමට හැකි පිරිසක් වශයෙනි. දෙවි බඹුන්ගේ චිත්ත සන්තානයේ සර්වඥතා ඥාණය පහල වන්නේ නැත. එය පහළ වන්නේ මිනිස් සිත තුල පමණි. ඒ අනුව මිනිසත් බව කොයිතරම් වටිනවාදැයි තේරුම් ගැනීමට මෙය හොඳ උදාහරණයකි.

කරුණාව, දයාව, ඉවසීම, මුදිතාව, මෛත්‍රීය වැනි මානුෂීය ගුණාංගයන් වඩ වඩාත් දියුණු කරගැනීම නිසා පුද්ගලයා වඩ වඩාත් සමාජය තුළ බබලයි. බොහෝ දෙනාගේ ප්‍රසාදයට පත්වෙයි. නමුත් වර්තමාන සමාජය දෙස විමසිල්ලෙන් බලන විට පෙනී යන්නේ මානුෂීය ගුණාංගයන් පසෙකලා පවට බරක් වී සමාජයට අසම්මත ක්‍රියා සිදුකරමින් තමන් ලැබූ දුනුම් මිනිසත් බවට නිගා කරන පිරිස් බහුලව ජීවත් වන බවයි. ධර්මය පිළිබඳ අවබෝධයක් නැතිකම එයට ප්‍රධාන හේතුවයි. හොඳ නරක, යහපත් අයහපත් කටයුතු හඳුනා නොගෙන ජීවත් වන්නේ ඒ නිසාවෙනි. සෑම ක්‍රියාවකටම ප්‍රතික්‍රියාවක් තිබේ. පවු කරන්නා මෙලොව පරලොව අනේක වූ දුක් විඳ දුගතිගාමී වෙයි. පින් කරන්නා මෙලොව පරලොව අනේක වූ දිව්‍ය මානුෂීය සැප විඳ නිර්වාණාවබෝධය ලබා ගනී. සෑම විටෙකම සල් හෝ අකුසල් සිදු කරනු ලබන්නේ සිත, කය, වචනය, යන තිදොරින්ය. මෙම සිත, කය, වචනය යන තිදොරින් සිදුවන අකුසල් සිදු කිරීමට මේ තුන්දොර හික්මවා ගත යුතුය.

ඒ තුළින් සීලය ආරක්ෂා වේ. බෞද්ධයාගේ නිත්‍ය ශීලය පංච ශීලයයි. එය ආරක්ෂා කිරීම තුලින් සිත කය වචනය තුන්දොර සංවර කරගැනීමට හැකිය. පරපණ නැසීම, අන්සතු දේ ගැනීම, කාමය වරදවා හැසිරීම, බොරු කීම, මත්පැන් භාවිතය යන පස් පව්වලින් වැළකී මාපියන් හට ඇප උපස්ථාන කරන වැඩිහිටියන්ට ගරු කරන පිදිය යුත්තන් පුදන සියළු සත්වයන් කෙරෙහි මෙත් සිත පතුරන කාරුණාව දයාව ඉවසීම සමානාත්මතාව මුදිතාව වැනි ගුණාංගයන් පූර්ණය කරන පුද්ගලයින් තම විමුක්තිය උට්ඨාන වීර්යෙන් යුක්තව සලසා ගනී. සදාතනික සුවය විඳියි. සසර ගමන කෙටිකර ගනී.

*.. යාදිසං වපතෙ බීජං - තාදිසං කරතෙ ඵලං ,*

ඔබ යමක් වපුරනවාද එහි අස්වැන්න ඔබට ලැබේ. එසේම කරන කියන සිතන පින් පව්වල විපාකයන්ද එලෙසින්ම විඳීමට සිදුවෙයි. මනාව සිහියෙන් යුක්තව කටයුතු කර ඉතා දුර්ලභ වූ මේ ජීවිතයේ නිසි ප්‍රයෝජන සලසා ගැනීමට අනලස්ව කටයුතු කරන්න. ලෞකික සැප සම්පත් සිතට සුවයක් ලඟා කරගත නොහැක. එම සැපය තාවකාලිකය. ආධ්‍යාත්මික ගුණ වර්ධනය කොටගෙන ලෝකෝත්තර සුවය විඳින්න.

බුදුරජාණන් වහන්සේ පමණක් නොව සාරිපුත්ත මහරහතන් වහන්සේ වැනි මහා ශ්‍රාවකයන් වහන්සේලා නොයෙක් අවස්ථාවල කරන ලද දේශනාවල සමතිස් බෝධිපාක්ෂික ධර්ම අත්කරගත වී තිබේ. බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයේ සාම ග්‍රාමයේ වැඩවසන සමයේ ආනන්ද තෙරුන් හා චුන්ද සාමනේරයන් අමතා තමන් අවබෝධ කොට ගෙන ඇති ධර්ම ලෙසින් මෙම බෝධිපාක්ෂික ධර්ම හඳුන්වා දී ඇත. ඒ බව මජ්ඣිම නිකායේ සාමග්‍රාම සූත්‍රයේ දැක්වේ. මේ කරුණම නැවත බුදුරජාණන් වහන්සේ විසින් කුසිනාරා නුවර බලිහරණ වනපෙදෙසේදී වදාල බව මජ්ඣිම නිකායේ කිත්ති සූත්‍රයෙන් පෙනේ. දීඝ නිකායේ සංගීත සූත්‍රයේ බුදුරජාණන් වහන්සේගේ අනුදැනුම පරිදි සැරියුත් තෙරුන් ධර්මය සංඝායනාවක් ලෙසට භික්ෂූන් අමතා දේශනා කළ ධර්ම කොටස් රාශියක් දැක්වේ. නමුත් මෙහි පංච බලය නොදැක්වේ.

සද්ධා බලය හැරුණු කොට අනෙක් බල සතර සඳහන් වේ. ප්‍රභේද වශයෙන් තිස්හතක් වන මෙම බෝධි පාක්ෂික ධර්ම සමූහය පරමාර්ථ ධර්ම වශයෙන් සඝ, විරිය, ඡන්ද, චිත්ත, පඤ්ඤා, සද්ධා, ඒකන්ගතා, පීති, පස්සද්ධි, තත්‍රමජ්ඣත්තතා, විතක්ක සම්මවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යනුවෙන් 14ක් වෙයි. සංයුක්ත නිකායේ අසංඛත සංයුතියෙහි අසංඛත වර්ගයෙහි සූත්‍ර හතළිස් පහක් දක්නට ලැබේ. ඒ අතර වැඩි ප්‍රමාණයක් සූත්‍රවල අන්තර්ගත වන්නේ බෝධි පාක්ෂික ධර්මයයි. ඒ හැමතැනකම සඳහන් වන්නේ ඒ ධර්ම සමූහය නිවන් මඟ බවත් නිවන් මඟ පිළිබඳ තමන් වහන්සේගේ අනුශාසනාව බවත් බුදුරජාණන් වහන්සේ අවධාරණය කොට ඇත.

යමෙක් මෙලොව යහපත් තැනක උපත ලබා ගෙවල් යාන වාහන ආදී නොයෙක් සැප සම්පතිස් පිරි ජීවිත ගත කරන්නේ පෙර කරන ලද කුසල් නිසාවෙනි. ඒ වුවත් ඒ කුසල් විපාක දී කෙදිනක හෝ නැතිවී යයි. යම් දෙයක් හටගනී නම් එය යම් කාලයක් පැවත කුමන මොහොතක හෝ නැතිවි යයි. ඒ නිසා වඩ වඩාත් කුසල් දහම වඩා මේ දුක් සහිත වූ සසර කතරින් එතෙර වීමට නොපමාව උත්සාහ කළ යුතුය. මිනිස් බව ලැබීම ඉතා දුර්ලභ වූ කරුණකි. අකුසලයට බරව කටයුතු කිරීම නිසා කල්ප ගණන් සසර දුක් විඳීමට සිදු වන බව දක්වා තිබේ. මිනිසාට මෙතෙක් යැයි නිගමනය කළ හැකි පමණ කාලයක් දුක් විඳීමට සිදුවේ. බුද්ධ දේශනාවේ සඳහන් ඉතා දුර්ලභ කරුණු සතරක් අප ලබාගෙන ඇත. එහි වටිනාකම නියමාකාරයෙන් තේරුම් ගෙන අයහපතින් මිදී ලැබෙන සෑම අවස්ථාවකදීම කුසල් සිත් පෙරටු කොටගෙන ගුණ ධර්ම වැඩිදියුණු කරගෙන බුදු පසේ බුදු, මහරහත් යන උතුමන් වහන්සේලා සැප යැයි නිවි සැනහී වදාළ උතුම් වූ නිර්වාණය සාක්ෂාත් කරගැනීමට අප්‍රමාදීව වීර්යෙන් යුතුව කටයුතු කරත්වා..! මොහොතකුදු සඟමොක් සුවය ලබා ගැනීමට පමා නොකල යුතුය.

රාජගුරු සරණ හිමි

# සදාචාර සංවර්ධනය තුළින්

# කාන්තා අයිතීන් සුරකිමු



තුරුලතා මුදුන්හී දියත පුරා අනේක විධ වර්ණයෙන් හැඩයෙන් මෙන්ම සුගන්ධයෙන්ද විකසිත වන පුෂ්පයෝ මුළු ලොවම සුන්දර කරති. නෙත ගැටෙන ගැටෙන හැම දෙනාගේම සිත සනසාලන ඒ අනේක විධ පුෂ්ප සමූහයට ලොව පුරා වෙසෙන ස්ත්‍රී රත්නයන් උපමා කර ඇත.සැබවින්ම එය අඟනා උපමාවකි. කාන්තාව වූ කලී සැබවින්ම සුන්දරය. නිර්ව්‍යාජය. අවිහිංසකය. ඇය මුළු ලොවම සදන්නිය. නලවන්නීය. සුන්දර කරන්නීය. සතපවන්නීය. එසේ නම් ලොවක් වටිනා ස්ත්‍රිය ගැන කථා කරන්නට මාර්තු 08 වැනි දිනයක් යොදා ගැනීමද අතිශයින් වැදගත්ය. කාන්තාවකගේ ජිහිටක්, උදව්වක්, උපකාරයක්, නොමැතිව මොළොව එළිය දකින, ජීවත්වන සත්වයෙක් නැත. කාන්තාවක් ලෙසින් ඉපදීම පාපකර්මයක් ලෙසත්, පිරිමියෙකු ලෙස ඉපදිම පුණ්‍ය කර්මයක් ලෙසත් දහම නොදන්නවුන් සලකන ලෝකයේ පුරුෂයාට උප්පත්තිය ලබා දෙන්නේද ගැහැණියයි. උපන් පසු ඔහු හදා වඩා ගන්නේද, මූලික අධ්‍යාපනය ලබා දෙන්නේද මව නැමති ගැහැණියයි. විවාහයෙන් පසු පිරිමියෙකුගේ මරණය දක්වා ඔහුගේ සියළු ඕනෑ එපාකම් සොයා බලා ඉටුකරන්නීද ගැහැණියකි. එසේනම් ගැහැණියකගෙන් තොරව පුරුෂයෙකුට මෙලොව බිහිවීමටවත්, ජීවත් වීමටවත්, ජීවිතය එලදායි කරගැනීමටවත් නොහැකිය. සෑම සාර්ථක මිනිසෙකු පිටුපසම ගැහැණියක් ඇත." යනු ප්‍රසිද්ධ කියමනකි. එය සැබෑ සත්‍යකි. ලොව පවතින්නේ හිරුගේ රශ්මියෙනුත් මවගේ කිරිවලිනුත් " යන කියමනේ ගැඹුරු අර්ථයක් ඇත.

එහෙත් එවන්වූ ස්ත්‍රී රත්නයන් උපන්දා සිටම මියෙන තුරු අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් විදින්නේද ලොව පුරා වෙසෙන ශ්‍රේෂ්ඨ යැයි කියා ගන්නා ඇතැම් පුරුෂයන්ගෙන් වීම ඉතාම කණගාටු දායක කරුණකි. කාන්තාවන් තම ජීවිතයේ සෑම කාලයකදීම කවර හෝ පුරුෂයෙකුගේ ආදරය රැකවරණය පතන්නීය. සෑම කුඩා දියණියක්ම තම පියාගෙන් මෙන්ම සහෝදරයින්ගෙන් රැකවරණයක් ලැබෙන්නේ යැයි එකහෙලා විශ්වාස කරයි. එසේම තරුණියක් විවාහා වූ කළ සිය සැමියාගේ ආදරයත් රැකවරණයත් පතන්නීය.යම් දිනක සැමියා අහිමි වී වැඩිමහළු පුතණුවන් කෙනකු සිටින්නේ නම් ඔහුගේ රැකවරණය තමා මියෙන තුරුම පතන්නීය. එහෙත්

**"නීති පනවන්නෝද නීති ක්‍රියාත්මක කරන්නෝද නීති පිළි නොපදිති. එවන් සමාජයක් තුළ කාන්තාවන්ට මෙවැනි දේ සිදු වීම පුදුම වන්නට කරුණක් නොවේ"**

වත්මන් සමාජය ගත් කළ ඇය පතන්නා වූ ආදරය රැකවරණය වෙනුවට ඇයට තම පියාගෙන්, සොහොයුරාගෙන්, සැමියාගෙන් මෙන්ම තම කුසින් බිහිකොට හදාවඩා ගත්තා වූ පුතණුවන්ගෙන් පවා අනේක විධ දුක් කරදර විදින්නට සිදුව ඇත. එසේ වූ කළ සමාජයේ වෙසෙන අනෙකුත් පිටස්තරයන්ගෙන් ඇයට විදින්නට වන කරදර විපත් පිළිබඳව අසන්නට දෙයක් නැත.

එදා මිහිඳු මහා රහතන් වහන්සේ අප රටට වැඩම වූ දා සිට අපේ සංස්කෘතිය බුදු දහමට අනුව හැඩගැසුන එකක් විය. ඒ සංස්කෘතිය තුළ වසර දහස් ගණනක් යන තුරාම කාන්තාවට අවශ්‍ය කරන ආරක්ෂාව රැකවරණය සමාජය තුළින් ලැබුණි. සියළු වස්ත්‍රාභරණයෙන් සැරසී රූමත් තරුණියකට ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා එනම් ලංකාවේ එක් කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා කිසිදු උවදුරකින් තොරව ගමන් කළ හැකි විය. එයට ප්‍රධානතම හේතුව වූයේ මිනිසා තුළ තිබුණු ආධ්‍යාත්මික ගුණවගාවත්, බෞද්ධ සංස්කෘතියත් නිසාය. බෞද්ධ සංස්කෘතියට අනුව සිය ආධ්‍යාත්මය සරු කරගත් ශ්‍රී ලාංකිකයා හැම විටම පන්සිල් සුරැකීම මෙයට හේතු විය. එබැවින් ඔවුන් අතින් ප්‍රාණගාතය, අදත්තාදානය, කාම මිත්‍යාචාරය සිදු නොවීය. තම බිරිඳ දරුවන්ට පමණක් නොව සතා සිව්පාවුන්ට වත් ඔවුන්ගෙන් කරදර විපත් සිදු නොවුණි. අන් සතු දෑ පැහැර ගැනීම, කම් සැප වැරදි ලෙස සිදු කිරීම, මහත් වූ පාපයක් බව ඔවුහු සැලකූහ. එබැවින් සියළු වස්ත්‍රාභරණයෙන් හෙබි රූමත් කත නිරුපද්‍රිතව හුදකලාව තම කාර්යයන් සඳහා නිදහසේ හැසිරුනි. අද බොහෝ පුරුෂයන් විසින් කාන්තාව බොරුවෙන් රවටනු ලබයි. එසේ සිදු කොට ඇයගෙන් තම කාමශාවන් ඉටුකරගනු ලබයි. එසේ සිදු කොට ඇය අතරමං කිරීම මෙන්ම මරණයටද පත් කරයි. එහෙත් නිසි පන්සිල් සුරැකි එදා සමාජය තුළ කිසිවෙකුත් මුසාවාද නොතෙපලාය. මදයට ප්‍රමාදයට පත් නොවුණි.

එහෙත් අද සමාජය හාත්පසින්ම වෙනස්ය. කොතෙක් බුදු බණ දෙසුවත්, කොතෙක් බුදු බණ කණ වැකුනත්, රාජ්‍ය පාලකයන්ගේ සිට සියළු දෙනාගේම පාහේ එකදු ශික්ෂා පදයක් වත් ආරක්ෂා කරන බවක් නොපෙනේ. පංච ශීලයට අදාළ දෑ පිඅළිබඳව විවිධ නීති රීති ඇත. නීති පනවන්නෝද නීති ක්‍රියාත්මක කරන්නෝද නීති පිළි නොපදිති. එවන් සමාජයක් තුළ කාන්තාවන්ට මෙවැනි දේ සිදු වීම පුදුම වන්නට කරුණක් නොවේ.

එහෙත් වත්මන් සමාජය

15 පිටුවට....

සී.ජේ.සිල්වා

i පිටුවෙන්....

තුළ අසන්නට, දකින්නට ලැබෙන්නේ මිනිසුන්ගේ රාගය අවුස්සන, වෛරය ඇති කරන. පළිගැනීම් වලට පොළඹවන, අනියම් සබඳතාවලට රුකුල් දෙන දේවල්ය. මල් සුවඳට ඇදෙන බඹරුන් සේ " මිනිසුන් ජනමාධ්‍ය, කටකතා ඔස්සේ එන මේ දේවල් වලට පෙළඹෙති. පන්සල, පල්ලිය, කෝවිල ඇසුරු කරමින් සදාචාරාත්මක සංවර්ධනය කිරීමට නොයෙකුත් වැඩ සටහන් තිබුණද ඒ තුළින් තම ආධ්‍යාත්මය සංවර්ධනය කරගන්නේ අතළොස්සකි.

කුඩා දරුවාගේ සිට වයෝවෘද්ධයා දක්වා බහුතරයක් සොයනුයේ මනස විකෘති කරගනිමින් තාවකාලික වින්දනයක් ලැබීමටය.

මෙවැනි වූ සමාජය තුළ කාන්තාවද විවිධාකරයෙන් පීඩිහීමට පත්ව ඇත. උදාහරණයක් ලෙස ප්‍රකාශ කළහොත් පාසැල් වයසේ දියණියන් හැසිරෙන්නේ විවාහයට සුදුසු තරුණියන් ලෙසය. දරුවන් සිටින මව්වරු තම ශ්‍රේෂ්ඨ මව් පදවිය පසෙකලා තරුණියන් මෙන් හැසිරෙමින් පුරුෂයන්ගේ සිත් දිනා ගැනීමට කටයුතු කරති. මිත්තනියන්ද තමන්ගේ තත්වය අමතක කර තරුණියන් සේ හැසිරෙමින් ගෞරවය නැති කර ගනිති. මෙවැනි අනිසි හැසිරීම් රටාව නිසා වත්මන් බාල, තරුණ, මහළු කාන්තාවන් විනාශ වී විවිධ අතවර වලටද ලක්වේ.

මෙසේ නොවී තම තමන්ගේ ගෞරවය ආරක්‍ෂා කරගෙන සිටින දැරියන්, තරුණියන්, මව්වරු, මිත්තණියන් නැතුවා නොවේ. එසේ සිටින කාන්තාවන්ගේ ගෞරවයද, ආරක්‍ෂාවද සැලසී ඇත.

බෞද්ධ සංස්කෘතිය අගය කළ එදා සමාජයේ යුවතිය විවාහපත් වූයේ මව්පියන්ගේ ආශිර්වාදය සමඟය. එතෙක් ඇය කුමරි ඹබසර ආරක්‍ෂා කළාය. විවාහයෙන් පසු මියෙන තුරුම පතිදම් රැකීමද ශ්‍රේෂ්ඨ අයුරින්ම ඈ සිදු කළාය. සිය සැමියාට දෙවියෙකුට මෙන් ගරු කළ ඈ සැමියාගේ ගෞරවයද නිසි ලෙස රැක්කාය.

මෙසේ වාසය කළ පතිණියට ස්වාමි පුරුෂයා අඩම්තේට්ටම් කළේ නැත. ඇයට අසාධාරණය වන පරිදි කිසිදු අකටයුත්තක් ද නොකළේය. අද ද මෙවන් වූ ආදර්ශමත් අය අප රට තුළ නැතුවා නොවේ.

ගුණ දහමින් යුතු මව්වරු බිහිකළ හැදූ වැඩූ දරුවන්ද ගුණ දමින් ඥාන නුවණින් පෝෂණය වූහ. මෙසේ සත් ගුණයෙන් පිරිපුන් දරුවෝ මව් පිය ගුණය මහ සයුර සේ අගය කළහ. ඔවුන්ට මව්පියන් බරක් නොවුණි. එබැවින් මහළු මඩම්ද අවශ්‍ය නොවිය. කුස තුළම දරුවන් මරා දමන්නට දරුවන් සමඟ සිය දිවි තොර ගැනීමට තරම් ඔවුහු සැහැසි නොවූහ. ඇතිවන ගැටළු ඉවසීමෙන් ප්‍රඥාවෙන් විසදා ගැනීමට තරම් ශක්තියක් ඔවන් තුළ ඇතිවිය.

බෞද්ධ ආකල්ප තුළ තමන්ගේ ජීවිතය කුඩා කළ පටන් සකස් කරගත් කත මධ්‍යම වයසට පත් කල්හී ආගමානුකූලව බණ භාවනාදියෙහි නිරත වෙමින් අනාගත පරපුරද සුමගට ගැනීමෙහිලා සමත් වූහ.

එහෙත් බෞද්ධ ආකල්ප වලින් තොර වූ වත්මන් කත ස්භාවිකව උරුමවන මහළු බවට අනිත්‍ය තාවයට එරෙහි වෙමින් තරුණ බව රැක ගැනිම සඳහා බොබෝ වියදම් දරමින් විවිධ දේ සිදු කරති. මහළු සැමියා ප්‍රතික්ෂේප කරමින් ද්වේශ සහගත ලෙස ක්‍රියා කරති. එවිට ස්වාමියාටද දරුවන්ටද පිළිලයක් වන ඈ නිතැතින්ම මහළු මඩමටද, අපායටද වැටෙති. මෙය සිදු වන්නේ කාන්තාවට පමණක් නොව පුරුෂයාටද මේ දේ සිදු වේ.

එබැවින් යහපත් ආකල්ප වර්ධනය කර ගනිමින්, ප්‍රඥාවන්තව තම තමන් සතු කාර්යභාරයන් හා වගකීම්ද තමා කවුරුන්ද යන්නත් වටහාගෙන ජීවිතය පවත්වන්නේ නම් අලුත් අලුත් නීති තුළ මානව සුරක්‍ෂිත තාවය කාන්තා ආරක්‍ෂාව ළමුන්ගේ ආරක්‍ෂාව සැලකිය යුතු නැත. තම අයිතීන් ලබාගැනීම සඳහා උද්ඝෝෂණ කළ යුතු නැත.

13 පිටුවෙන්....

අර්ථචර්යාව, සමානාත්මතාවය යන්නා වූ සතර සංග්‍රහ වස්තූන්ගෙන් පුද්ගලයාට සංග්‍රහ කළ යුතුය. මෙකී සතර සංග්‍රහ වස්තූහු ගමන් කරන රියක කඩ ඇණය බඳු යැයි සූත්‍රගත දේශනාවෙහි සඳහන්ය.

සතර සංග්‍රහ වස්තුවෙහි තොර වූ මව්පියන්ට දරුවන්ගෙන් ගරු බුහුමන් හෝ පුද සැලකිලි අපේක්ෂා කළ නොහැකිය. මෙකී කරුණු කෙරෙහි පණ්ඩිතයෝ මනාව කල්පනා කරත්ද ඔවුන් උසස් තත්වයට පත් වීමත්, පැසසුමට බඳුන් වීමත් නවතා ලිය නොහැක.

ක්‍රමයෙන් පරිහාණිය කරා ගමන් ගනු ලබන නූතන සමාජය යහතත්වයට ගැනීමට මෙකී සූත්‍ර දේශනාව ඉවහල් වනු නොඅනුමානය. තම පැවැත්ම, තම යහපත, තමාගේ සුභ සිද්ධිය ගැන පමණක් ආත්මාර්ථකාමීව සිතන්නා වූ තැනැත්තන් හට බොදු ප්‍රඥාප්ති හැදෑරීම වටිනු ඇත.

නූතන ලොව වෙසෙන සියලු සත්වයන් නිර්මල බුදු දහමේ මෙකී කරුණු කෙරෙහි අවධානය යොමු වනු දැක්ම මනුෂ්‍යත්වය අගය කරන්නා වූ සැමගේ පැතුම වනු නියතය.

12 පිටුවෙන්...

තනසීව ළඟ වාසය කරන වකවානුවේ දී එතුමන්ට කුපික්කල මහාතිස්ස තෙරුන් නැවත හමුවිය. මින්පසු ඒ හිමියන්ගේ වාසස්ථානයේ වූ අච්ඡගල්ල විහාරයේ නැවත පැවති බුද්ධ පූජාවකට රජතුමා සහභාගීවීම වැදගත් සිද්ධියකි. සමහර විට මහාතිස්ස තෙරුන් රජතුමා හමුවීමට පැමිණියේ ඔහුගේ අනාගත කටයුතු උදෙසා ආශිර්වාද ලබා ගැනම පිණිස සංවිධානය කළ මෙම කටයුත්තට ඇරයුම් කිරීමට වීමට බැරි නැත. කෙසේ වුවද මෙතැන් සිට කතා පුවත අවුල් වෙයි. මෙම අච්ඡගල්ල විහාරයත්, මේ සිද්ධියේ තවත් වැදගත් තැනක් වන ආකාසචේතිය නම් ස්ථානයත් රෝහණයට ගෙන යාමට නූතන ඉතිහාසකරුවන් දැරූ උත්සාහය නිසාම මේ අවුල් තත්වය ඇතිවී තිබේ.

අච්ඡගල්ල විහාරයත් ආකාසචේතියත් සී.ඩබ්ලිව්. නිකොලොස් විසින් හැඳිනගෙන ඇත්තේ රෝහණයේ ස්ථාන වශයෙනි. ඔහු අච්ඡගල්ල හැඳිනගෙන ඇත්තේ රෝහණයේ ස්ථාන වශයෙනි. ඔහු අච්ඡගල්ල හැදිනගෙන නැතත් ආකාසචේතිය රෝහණයේ කාවන්තිස්සට සම්බන්ධ ආකාසචේතිය ලෙස ගැනීමට ඔහුට සිදුවිය. මහාචාර්ය පරණවිතානත් ඔහුගේ මතය වැඩි විචාරයකට භාජනය නොකරම පිළිගැනීම නිසා මෙම මතය තහවුරු වී ඇත. පාලි හෝ සිංහල කිසිම වංශ කථාවක වට්ටගාමිණී අභය රෝහණයේ සැඟවී සිටි බවක් හෝ එහි සේනා රැස්කල බවක් සඳහන් නොවෙයි. ඔහු සැඟවී සිටියේත් අවසානයේදී සේනාව රැස්කළේත් මලය දේශයේදී බවට හැම මූලාශ්‍රයක්ම එකඟ ය. විශේෂයෙන් වංසත්ථප්පකාසිනී කතුවරයාට මේ ස්ථාන හා ප්‍රදේශය පිළිබඳ නිවැරදි දැනීමක් තිබූ බව කතා පුවතේ එන එක් තැනක් මෙතුමන්ගේ කාලයේදී මොරගල්ල නමින් හැඳින්වී යයි සඳහන් කිරීමෙන් ම පෙනේ.

නූතන ඉතිහාසකරුවන් සියලුම වංශකතා තොරතුරු ප්‍රතික්ෂේප කොට වට්ටගාමිණී අභය රෝහණයට ගෙව ගිය ආකාසචේතිය පිළිබඳ සාකච්ඡාවක් අවශ්‍යයි සිතමු. ආකාසචේතිය නමින් හැඳින්වෙන ස්ථාන අඩුම තරමින් දෙකක් වත් පාලි වංශකථාවල හා අට්ඨකථාවල සඳහන් වේ. ඉන් එකක් රෝහණයේ වූ චේතියපබ්බත නම් විහාරයක් සමීපයෙහි පිහිටියේය. මෙම ස්ථාන ආකාසචේතිය නමින් හැඳින්වුණේ පර්වතය මුදුනේ පිහිටි නිසාය. මෙම ස්ථානය පිහිටියේ මාගමට නැගෙනහිරින් පැරණි රෝහණයට අයත් ප්‍රදේශයේය. මෙම ප්‍රදේශය ලංකාවේ වංශකතාවල කිසිම අවස්ථාවක මලයදේශය නමින් හඳුන්වා නැති බව අප විශේෂයෙන් සිහි තබා ගත යුතුය. රෝහණයත් මලය දේශයත් හැඳින ගැනීමේදී මහාවංශ කතුවරයාට හෝ වංසත්ථප්පකාසිනී කතුවරයාට කිසිම අපහසුවක් නොවූ බව ඉහතින් ද පෙන්වා දුනිමු.

දෙවන ආකාසචේතිය වට්ටගාමිණී අභය කතා පුවතේ එන ස්ථානයයි. මෙය රජු සැඟවී සිටි මලයදේශයට අයත් ස්ථානයක පිහිටි බව ඔහු හා සම්බන්ධ වංශකතා පුවත පරීක්ෂා කාරීව කියවන්නෙකුට මැනවින් පෙනී යයි. මහාචාර්ය පරණවිතාන මෙන්ම සී. ඩබ්ලිව්. නිකොලොස් ද වංසත්ථප්පකාසිනී විස්තරය මෙන්ම වංශකතා පුවත ච කවර හෝ හේතුවක් නිසා සාවද්‍ය ලෙෂ අර්ථ නිරූපණය කර ඇතැයි කීම ඒ විශිෂ්ට උගතුන්ගේ ශාස්ත්‍රවෛශාරද්‍යයට කරන අවමානයක් නොවේ. මෙහිදී වංශකතා පුවත මෙන්ම වංසත්ථප්පකාසිනී විස්තරය ද උපුටා දැක්වීම අනුචිත නොවේ.

කුම්භීලක මහාතිස්සථෙරං දිස්වා මහායසො
අච්ඡගල්ලවිහාරම්හි බුද්ධ පූජාමකාරයි
වත්ථුං සොධෙතුමාරුළ්හෙ ආකාසචෙතියංගණං
කපිසීසෙ අමච්චංගි ඔරොහන්තෙ මහීපති"

කුම්භීලක මහාතිස්ස (කුපික්කල මහා තිස්ස) තෙරුන් සංවිධානය කළ බුද්ධ පූජාව පැවැත්වූයේ අච්ඡගල්ල විහාරයේදී බවත්, පූජා වස්තූන් දෝවනය කිරීම සඳහා රජු නැගුණේ එම විහාරයේම තිබුණු ආකාසචේතියංගණයට බවත් මහාවංශයෙහි එන මේ ගාථා දෙකින්ම මනාව පැහැදිලි වේ. එහෙත් තවත් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා අපි වංසත්ථප්පකාසිනියේ පිහිට සොයමු.

"බුද්ධ පූජංති මාලාගන්ධධූප පූජංති දන්තබිබං වත්ථුං සොධෙතුං
ආරුළ්හෙ ති සදෙවිකස්ස රඤ්ඤො උපගමනා පුරෙතරං එව
චෙතියංගණෙ වත්ථුසොධනත්ථාය ආකාස චෙතියංගණං ආරුළෙහ

අච්ඡගල්ල විහාරයෙහි වූ බුද්ධ පූජාව සඳහා ආකාශචේතියංගණයෙහි දී පූජා වස්තූන් සෝධනය පිණිස රජු ගිය බව මෙයින් මනාව පැහැදිලි වේ. ආකාශචේතියංගණය කරා නැගෙමින් සිටි බිසොවට ඉඩ නොදුන් කපිස්ස රජු විසින් මරා දැමුවේ මේ අවස්ථාවේදීය. අච්ඡගල්ල විහාරයත් ඒ වූ ආකාශචේතියංගණයත් හැඳින ගැනීමේදී සමහර උගතුන් මුලා නොවූ බව පාලි සංඥානාම ආකාරාදියෙන් පෙනේ.

# බුදු හිමිගේ



# උපමා භාවිතය

චක්කං ව වහතෝප දං (ගොනාගේ පා අනුව යන කරත්ත රෝදය මෙන්)
අබ්භාමුත්තෝව චන්දිමා (වළාකුලින් මිදුනු සඳ මෙන්)
වාතෝ රුක්ඛං ව දුබ්බලං (වාතය දුබල ගස පෙරළා දමන්නාක් මෙන්)
දබ්බී සූප රසං යථා (හැන්ද රස නොදන්නාක් මෙන්)
වාතො සෙලං ව පබ්බතං (වාතය ගල් පව්ව සෙලවීමට නොසමත් වන්නාක් මෙන්)
කුම්භූපමං කායමිමං විදිත්ව (කය මැටි බඳුනක් මෙන්)
නගරූපමං චිත්තමිදං ඨපෙත්වා (සිත නුවරක් මෙන්)
මධුවා මඤ්ඤතී බාලො (බාලයා මී පැණි මෙන් සිතයි)
සජ්ජු ඛීරංව මුච්චති (කිරි දෙවු කළම නොමිදෙන්නාක් මෙන්)
නිධීනං ච පවත්තාරං (නිධානයක් පෙන්වන්නාක් මෙන්)
උදකං හි නයන්ති නෙත්තිකා (දියාලුවෝ අවශ්‍ය තැනට තැනට ජලය ගෙන යන්නාක් මෙන්)
දාරුං නමයන්ති තච්ඡකා (හී වඩුවෝ කැමති පරිදි දැව දඬු සකස් කරන්නාක් මෙන්)
හංසාව පල්ලලං හිත්වා (විල හැර යන හංසයන් මෙන්)
ආකාසේව සකුන්තානං (අහසේ ඉගිලෙන පක්ෂීන් මෙන්)
උදබින්දු නිපාතේන (දිය බින්දු එක් වීමෙන් භාජනය ජලයෙන් පිරෙන්නාක් මෙන්)
ගාවො පාචෙති ගොචරං (ගවයන් තණබිම් කරා දක්වන්නාක් මෙන්)
අග්ගි දණ්ඩෝව තිප්පති (ගින්නෙන් දැවෙන්නාක් මෙන්)
බලිවද්දෝව ජීරති (ගොනාගේ මස් වැඩෙන්නාක් මෙන්)
යථා බුබ්බුලකං පස්සේ (දිය බුබුලක් දක්නාක් මෙන්)
හංසා දිච්ච පථෙ යන්ති (හංසයින් අහසේ ගමන් කරන්නාක් මෙන්)
තත්තෝ අග්ගිසිඛූපමෝ (ගිනි ගුලියක් ගිලින්නාක් මෙන්)
උදබින්දු ච පොක්ඛරං (ජල බින්දුව නෙළුම් කොළයෙහි නොරදන්නාක් මෙන්)

ධම්ම පදය ඇසුරෙන්

ගලගෙදර රතන වංශ හිමි

# පරිසරය සමග බැදුණු බෞද්ධ සිරිත් විරිත්...



පරිසරයේ ඇති වැදගත්කම ලෝකයාට අවබෝධකරදුන් ශාස්තෘන් වහන්සේ අපගේ බුදුරජාණන් වහන්සේය. සොබා දහමින් බැදුනු පරිසරය උන්වහන්සේ වර්ණනා කල සේක. "රමණීයානි අරඤ්ඤානි, යත්ථ රමණීමනෝ " යන බුදු වදනින් එය පැහැදිලි වේ. එයට ප්‍රධාන හේතුවනම් පරිසරය මිනිසාගේ කායික හා මානසික සුවයට බලපාන බැවිනි. සිත පිරිසිදුකර ගැනීමට ශාන්තවූත්, සුන්දරවූත් පරිසරය බලපාන්නේය. බාහිර පිරිසිදුකම සඳහා ශරීරය පිරිසිදුව තබාගැනීම, ඇඳුම්, පැලඳුම් පිරිසිදුව තබාගැනීම ඉතා වැදගත් වෙයි.

ඒ සඳහා බෞද්ධ ජනතාවට බුදුදහමින් ලැබෙන උපදෙස් ඉතා වැදගත්ය. භික්ෂූන් වහන්සේලාගේ එදිනෙදා ජීවිත සකස් වී ඇත්තේද එම උපදෙස් හා අවවාද අනුවය. උදෑසනින්ම අවදිවන භික්ෂූන් වහන්සේ, තම කාමරය සකස්කොට එය පිරිසිදුකර මලු පෙත්මන් හැමදීම සිදු කරනු ලබයි. ඉන් පසු ශරීරය පිරිසිදු කර ගෙන මල් කඩා විහාර වන්දනාකර, තෙරුවන් නමදියි. තම ගුරුවරයාටද වන්දනාකිරිම සිදුකරනු ලබයි. ඉන්පසු දන් වැලදීමත් අනතුරුව ධර්මයෙහි යෙදීමත් දක්නට ලැබේ.

බෞද්ධ ගිහි ජනතාවට බෞද්ධ භික්ෂූන් වහන්සේ අනුගමනය කරමින්, තම ජීවිතය හැඩගස්සා ගැනීමට හැකියාව තිබේ. විහාරස්ථානයකට ඇතුල්වන කෙනෙකුට තම සිතත්, ගතත් මනා කොට සංවර ගැනීමට හැකියාවක් ඇතිබව කිව හැකිය. විහාරස්ථානය ආදර්ශයට ගෙන තම නිවසත්, ඒ අවට ඇති පරිසරයත්, සුන්දරත්වයට පත්කර ගැනීමට හැකියාව පවතී. නිවසට යන පාරද, පිරිසිදුකර ගැනීමද වැදගත්ය. පාර දෙපස මල්ගස් සිටුවා ඒවා ආරක්ෂාකර ගැනීමෙන්, පූජාවට අවශ්‍ය මල් නෙලාගැනීමටද, අවස්ථාව උදාවේ.

නිවසේ ඇති ගෘහ උපකරණ නිසි පරිදි තැබිමද, ඒවා සතියකට වරක් හෝ පිරිසිදු කිරීමද, කල යුතුය. ඉවතලන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා බඳුනක් තැබීමද, එය ඉවත් කිරීම නිසි පරිදි සිදුකල යුතුවේ. දිනපතා අඳින ඇඳුම් සෝදා පිරිසිදුකර, තබා ගැනීමද වැදගත්ය. පළඳින පාවහන්, නිවසට ඇතුල්වනවිට ගලවා සුදුසු තැනක තැබිය යුතුය. අන් අයගේ නිවෙස්වලට යනවිටද ගෙයි ඇතුලත පාවහන් පැළඳීමෙන් වැලකී සිටීම හොඳ සිරිතකි.

ඊලගට වැදගත් වන්නේ, වැසිකිළි කැසිකිළි පද්ධතියයි. භික්ෂූන් වහන්සේලාගේ විනය ශික්ෂා පද මගින්ද, මෙය තහවුරුකර තිබේ. වැසිකිළිවත නමින්ද වත්පිළිවෙලක් සකසා තිබේ. එය සෑම භික්ෂුවක් විසින්ම පිළිපැදිය යුතුබවට විනයනීති පනවා තිබේ. බුදුරජාණන් වහන්සේ දහවෙනි (10) වස පාරිලෙය්‍ය වනයට වැඩම කෙලේද, භික්ෂූන්වහන්සේලා දෙපිරිසක් අතර ඇතිවූ, වැසිකිළි පාවිච්චි කිරීමේදී සිදු වූ වැරදි පිළිවෙලක් හේතු කොටගෙනය. වැසිකිළිය පාවිච්චි කිරීමෙන් පසුව එය පිරිසිදු කලයුතුය. වතුර ලබාගත් භාජනය, අවසානයේ මුනින් නැමිය යුතුය. වැසිකිළියක දොර වසා ඇති විටක දොරට තට්ටුකර විමසා බලා ඇතුල්වීම කලයුතුය.

වෙනත් කෙනකුගේ නිවසක කාමරයකට ඇතුල්වීමට පෙර දොර වසා ඇත්නම්, පළමුව දොරට තට්ටුකර කෙනෙකු සිටිදැයි විමසා බැලිය යුතුය. ඇතුලත කෙනෙකු සිටීනම් ඔහුගේ හෝ ඇයගේ අවසරය ලැබෙන තුරු එහි රැඳී සිටිය යුතුය. අවසරය ලදවිට ඇතුල්විය යුතුය. වැඩිහිටි කීප දෙනෙක් කථා කරමින් සිටින තැනකට අවසරයක් නොලබා එකවරම එතැනට නොයා යුතුය. අවසර ලැබීමෙන් පසුව එතනට යායුතුය. පරිසරයේ ඇති ගස්, වැල් කඩාදමා විනාශ කිරීමට කිසිවෙකුට අයිතියක් නැත. භික්ෂූන්වහන්සේලාටද ගස්වල අතු, කොළ, කඩීම විනයෙන් තහනම්කර ඇත. බුදුරජාණන් වහන්සේ තමන්ට සෙවන ලබාදුන් ඇසතු රුකට සතියක් මුළුල්ලේ අනිමිස ලේචන පූජාව පැවැත්වීම සිදුකර ඇත්තේද, ලෝකයාට ආදර්ශයක් ලබාදීම සඳහාය.

ගංගා ඇල දොලවල් අපවිත්‍ර කිරීමද, නොකළයතු බවට බුදු දහමෙහි සඳහන්කර ඇත. ඒවා ආරක්ෂාකිරීමත්, පිරිසිදුව තබා ගැනීමත් වැදගත්වන බව ද එහි දක්වා තිබේ.

වර්තමාන සමාජය දෙස බලනවිට පෙනීයන්නේ, පරිසරයට හානිකර සිදුවීම්වලින් යුක්තවන බවයි. ගස්, වැල් කපා දැමීම ගංගා, ඇල දොලවලට අපද්‍රව්‍ය දැමීම. කැලෑගිනි තැබීම. කසල පරිසරයට දැමීම, යන මේවා විශේෂයෙන් දැකිය හැකි වේ.

පරිසරයට හානි පමුණුවන්නා දේශද්‍රෝහියෙක් ලෙසට හැඳින්විය හැකිය. බුදු දහමෙන් ඉගැන්වෙන පරිසරය සමග බැදුණු සාරධර්ම අප හදවත් තුළට දැනෙන සේ අවබෝධ කොටගෙන එය ක්‍රියාත්මක කළ යුතුය. එවිට සුන්දර ලෝකයක් නිර්මාණය කර ගත හැකිය.

කේ.ඩී.ඒ.එස්.දිසානායක
තලවත්තේගෙදර